# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# 2012



දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை
**DEPARTMENT OF INLAND REVENUE - SRI LANKA**

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ
# කාර්ය සාධන වාර්තාව

# உள்நாட்டு இறைவரி ஆணையாளரின்
# செயலாற்றுகை அறிக்கை

# PERFORMANCE REPORT
# OF THE
# COMMISSIONER GENERAL OF INLAND REVENUE

# 2012


**මල්ලිකා සමරසේකර**

**மல்லிகா சமரசேகர**

**Mallika Samarasekara**



**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**உள்நாட்டு இறைவரி திணைக்களம்**

**DEPARTMENT OF INLAND REVENUE**

## 2012 වර්ෂය තුළ කාර්ය සාධනයේ සාරාංශය

රටේ දියුණුව උදෙසා ආදායම් රැස්කිරීමේ රජයේ අරමුණ ඉටුකර දීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2012 වසර තුළ හැකියාව ලැබුණි. 2012 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද මුළු ආදායම රුපියල් මිලියන 443,455 ක් විය. එය රජයේ මුළු ආදායමට 44.90 % ක දායකත්වයක් ලබාදුන් අතර, දළ දේශීය නිෂ්පාදනයෙන් 5.85% ක් විය.

බදු වාර්තා ඉදිරිපත් කිරීමේ අනුකූලතාවය වැඩි කිරීම පිණිස දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ සාර්ථක පියවර හේතුවෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවයේ වර්ධනයක් ඇති වී තිබේ. තොරතුරු ශාඛාව සහ බදු සේවා අංශය මගින් ගනු ලැබූ මූලික ක්‍රියාමාර්ග හේතුවෙන් නව ලිපිගොනු බොහොමයක් විවෘත කළහැකි විය.

වර්ෂය තුළ දී, බදු විගණනය නියාමනය කිරීම තුළින්, රුපියල් මිලියන 331,029 ක් වූ ප්‍රකාශ නොකළ ආදායම සහ පිරිවැටුම අනාවරණය කරගත හැකි විය. වසර තුළ පනවන ලද අතිරේක බදු ප්‍රමාණය රුපියල් මිලියන 14,893 ක් විය. (ආපසු ගෙවීම්, හිඟ බදුවලට හිලව් කිරීම ද අදළ විය.)

පැහැර හරින ලද බදු අඛණ්ඩවම අයකර ගැනීම සඳහා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග සඳහා පියවර අදාළ ප්‍රඥප්තිවල නිශ්චිතව දක්වා ඇත.

ව්‍යවස්ථාවන්හි යම් යම් විධිවිධාන සම්බන්ධයෙන් අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස්වලට අවශ්‍ය වූ බදු නීති අර්ථ නිරූපන කමිටුව, වසර තුළ සිද්ධීන් 54 ක් සම්බන්ධයෙන් අර්ථ දැක්වීම් නිදහස් කර තිබුණි.

රාජ්‍ය ආදායම වෙනුවෙන් ස්වකීය දායකත්වය හඳුනාගැනීම සඳහා බදු ගෙවන්නන්ට වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩවම සිදු කෙරෙමින් පවතින අතර, උපකාරයක් හෝ තොරතුරු බලාපොරොත්තු වන සෑම පුද්ගලයෙකුටම සහායදීම පිණිස බදු සේවා ඒකකය අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණයෙන් සමන්විත විය.

බදු ගෙවන්නන් මෙන්ම දෙපාර්තමේන්තුවෙහි නිලධාරී මණ්ඩලය ද දැනුවත් කිරීමේ අරමුණින් සම්මන්ත්‍රණ සහ දේශන සංවිධානය කර තිබුණි.

## දෙපාර්තමේන්තුවේ දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව, පූර්ණ වශයෙන් පරිගණක ගත කරන ලද පද්ධතියකින් සමන්විත වූ, බදු ගෙවන ජනතාව උදෙසා මහඟු සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත් වීම.

## දෙපාර්තමේන්තුවේ මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණපනත්වලට යටත්ව බදු අය කිරීම සහ ,

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

## උපාය මාර්ග හා ඉලක්ක

- ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, අනුකූලතාවය වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම.

- වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

- දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකි වනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම.

ප්‍රධාන නිලධාරීන්

| | |
|---|---|
| **මල්ලිකා සමරසේකර මහත්මිය** | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්** |
| **එච්.බී.ඒ.සෙනෙවිරත්න මහතා** | **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>බදු ප්‍රතිපත්ති සම්පාදන හා සංවර්ධන,ව්‍යවස්ථා සම්පාදන, තීරණ හා ජාත්‍යන්තර කටයුතු, ආයෝජන මණ්ඩල ව්‍යවසාය |
| **ඩී.එම්.නන්දාවතී මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>ඍජු බදු පරිපාලන, අය, නිශ්කාෂණ සහ පැහැර හරින ලද බදු අය කරගැනීම |
| **කේ.ඒ.පී. කලුආරච්චි මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>වක්‍ර බදු පරිපාලනය |
| **එල්.රාමනායක මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>විමර්ශන, බදු ආවේක්ෂණ හා අවදානම් කළමනාකරණය |
| **ඩබ්.එම්.මෙන්ඩිස් මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>ආර්ථික පර්යේෂණ සහ සැලසුම්, නීති, අභියාචනා සහ තොරතුරු |
| **ඒ.එල්.ඒ.සිරිසේන මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>ජාතිය ගොඩනැගීමේ බදු, තොරතුරු හා තාක්ෂණ බදු |
| **එච්.එම්.සී.අයි.ගුණසේකර මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>මානව සම්පත් කළමනාකරණය |

| | |
|---|---|
| ඩබ්.වී.පී.කරුණාරත්න මහතා | **ජ්‍යෙෂ්ඨ කොමසාරිස්**<br>අභ්‍යන්තර විගණන තක්සේරු පාලන |
| පී.ඒ.වී.ප්‍රේමරත්න මහතා | **ජ්‍යෙෂ්ඨ කොමසාරිස්**<br>කලාප I, 3 අංශය, උපයන විට ගෙවීමේ බදු, මුද්දර බදු සහ රඳවාගැනීමේ බද්ද (පොළී මත) |
| කේ.දහනායක මහත්මිය | **ජ්‍යෙෂ්ඨ කොමසාරිස්**<br>විශාල බදු ගෙවන්නන්ගේ අංශ, පැහැර හරින ලද බදු එකතු කිරීම් සහ නිශ්කාෂණ |
| කේ.ඒ.ජී.අබේරත්න මහතා | **ජ්‍යෙෂ්ඨ කොමසාරිස්**<br>සංස්ථාපිත බදු, රඳවාගැනීම් බද්ද (නිශ්චිත ගාස්තු මත) නීති |
| ඩී.බී.ජයසේකර මහතා | **ජ්‍යෙෂ්ඨ කොමසාරිස්**<br>විමර්ශන, කලාප II, කලාප III, ආර්ථික සේවා ගාස්තු, ඔට්ටු හා සූදු බදු |
| ඩබ්.අනුලාවතී මහත්මිය | **කොමසාරිස්**<br>මානව සම්පත් කළමනාකරණ |
| අයි.එම්.බී..සෙනෙවිරත්න මහතා | **කොමසාරිස්**<br>කලාප I |
| ආර්.එම්.ආර්.ඩබ්. මංචනායක මහත්මිය | කොමසාරිස්<br>සංස්ථාපිත බදු (4, 5, 5A, 5C, 10, 15)<br>රඳවාගැනීමේ බද්ද (වී.) හා නීති |
| ඩී.එම්.එල්.අයි.දිසානායක මහතා | **කොමසාරිස්**<br>විශාල බදු ගෙවන්නන්ගේ අංශය |
| ඒ.එන්.ගුරුගේ මහතා | **කොමසාරිස්**<br>සංස්ථාපිත බදු (4A, 5C, 5D, 14, 17, 1 සහ 2 අංශ) |
| පී.රෝහිණී මහත්මිය | **කොමසාරිස්**<br>අභ්‍යන්තර විගණන සහ තක්සේරු පාලන |
| ආර්.එම්.පී.එස්.කේ.රාජපක්ෂ මහත්මිය | **කොමසාරිස්**<br>තොරතුරු |
| ඒ.ඒ.ඩී.යූ.අබේසිංහ මහතා | **කොමසාරිස්**<br>කලාප II, 3 අංශය, උපයන විට ගෙවීමේ බදු, රඳවාගැනීමේ බදු (පොළී මත), සේවා නියුක්තික සේවා |
| ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය | කොමසාරිස්<br>බදු උපදේශක - මුදල් අමාත්‍යාංශය |
| ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා | **කොමසාරිස්**<br>එකතු කළ අගය මත බදු, වැට් ලියාපදිංචි, විකල්ප එ.අ.බ. හා ආ.බ. එකතු කිරීම් |
| ඩී.එම්.එස්. දිසානායක මහතා | **කොමසාරිස්**<br>බදු සේවා අංශය, මුද්දර ගාස්තු |
| එම්.ජී. සෝමචන්ද්‍ර මහතා | **කොමසාරිස්**<br>මානව සම්පත් සංවර්ධන |
| සී.එච්. වීරසිංහ මහත්මිය | **කොමසාරිස්**<br>තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ |
| එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය | **කොමසාරිස්**<br>පැහැර හරින ලද බදු අයකර ගැනීමේ අංශය |
| පී.කේ.ජී. සමරතුංග මහතා | **කොමසාරිස්**<br>එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම්, එකතු කළ අගය මත බදු විශේෂ විගණන |
| එස්. කරුණාරත්න මහත්මිය | **කොමසාරිස්**<br>ආර්ථික පර්යේෂණ හා සැලසුම්, අභියාචනා |
| ඕ.පී.පී.කේ. සිරිසේන මහතා | **කොමසාරිස්**<br>සම්පාදන හා සැපයුම් |
| කේ. ධර්මසේන මහතා | **කොමසාරිස්**<br>කලාප III |
| එච්.එම්.ජී. විජේසිංහ මහතා | **කොමසාරිස්**<br>**ජාත්‍යන්තර බදු ප්‍රතිපත්ති** |
| බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය | **කොමසාරිස් ***<br>බදු ප්‍රතිපත්ති |
| පී.බී. දිසානායක මහතා | **කොමසාරිස් ***<br>ජා.ගො.බදු, ආ.සේ.ගාස්තු, ඔට්ටු හා සූදු බදු |
| ඩී.ඩී.එන්.පී. කෝරලේ ආරච්චි මහතා | **කොමසාරිස් ***<br>අභියාචනා |

**සටහන:- * රා.සේ.කො. සභාවේ අනුමැතියට යටත්ව තනතුරට රාජකාරී පවරා ඇත.**

# පටුන


2012 වර්ෂය තුළ කාර්ය සාධනයේ සාරාංශය ....................iii
ප්‍රධාන නිලධාරින් ....................vii
පටුන ....................ix
වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු ....................x
**I කොටස - මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය ....................1**
**පරිච්ඡේදය 1 - මානව සම්පත් ....................1**
1.1 අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු. ....................1
1.2 උසස් කිරීම් ....................2
1.3 විශ්‍රාම ගැනීම් ....................2
1.4 විනය ක්‍රියා මාර්ග ....................3
1.5 පුහුණු කිරීම ....................3
1.5.1 අභ්‍යන්තර පුහුණුව ....................3
1.5.2 විදේශ පුහුණුව ....................4
**II කොටස - බදු පරිපාලනය ....................6**
**පරිච්ඡේදය 2 - ආදායම් රැස් කිරීම ....................6**
2.1 බදු ගෙවන්නන් සංඛ්‍යාව (ලිපිගොනු සංඛ්‍යාව) ....................6
2.2 මුළු ආදායම් රැස් කිරීම ....................7
2.3 මුළු ආදායම – මුදල් ප්‍රවාහය ....................9
2.4 මුද්දර සහ ජාතිය ගොඩ නැගීමේ බදු ආදායම පළාත් සභාවලට මාරුකිරීම. ....................10
2.5 ආදායම් රැස් කිරීම් – ස්වතක්සේරු පදනම සහ අනෙකුත් ....................10
2.6 රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දායකත්වය ....................11
2.7 වාර්තා සැපයීමේ අනුකූලතාවය ....................12
2.8 ආදායම් බදු රැස්කිරීම ....................12
2.8.1 වර්ෂය ඇතුළත ආදායම් බද්දට අදාළව සිදුකර ඇති ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්: ....................13
2.8.2 ආදායම් බදු රැස් කිරීම් - අංශ වශයෙන් වර්ගීකරණය කිරීම ....................15
2.8.3 ආදායම් බදු රැස්කිරීම - ප්‍රභවය අනුව වර්ගීකරණය ....................15
2.9 එකතු කළ අගය මත බදු රැස් කිරීම ....................16
2.9.1 එකතු කළ අගය මත බද්දට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් ....................16
2.9.2 කර්මාන්ත අනුව විශ්ලේෂණය ....................18
2.10 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම. ....................19
2.10.1 ජාතිය ගොඩනැගීමේ බදුවලට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්: ....................19
2.11 ආර්ථික සේවා ගාස්තු රැස් කිරීම ....................20
2.11.1 ආර්ථික සේවා ගාස්තු වලට අදාළව ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්වීම් ....................21
2.12 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම ....................21
2.13 රඳවාගැනීමේ බදු ....................21
2.14 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම. ....................22
2.15 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම. ....................22
2.16 මුද්දර බදු රැස්කිරීම ....................23
2.17 2008 සිට 2012 දක්වා දේශීය ආදායම් රැස් කිරීම් ....................23
**පරිච්ඡේදය 3 - වියදම් සහ ඵලදායිතා අනුපාතය ....................25**
3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම 2010 සහ 2011 සහ 2012 වර්ෂ සමග සැසඳීම ....................25
3.2 2012 පුනරාවර්ථන වියදම් විශ්ලේෂණය ....................26
3.3 ඵලදායී අනුපාතය ....................26
3.4 අභ්‍යන්තර විගණන ....................27
**පරිච්ඡේදය 4 - පැහැර හරින ලද බදු ....................28**
4.1 පැහැර හරින ලද බදු ....................28
4.2 හිඟබදු අඩුකිරීම සඳහා සැලසුම. ....................29
4.3 හිඟබදු ප්‍රමාණය 3% මට්ටමේ පවත්වා ගැනීම ....................29
**පරිච්ඡේදය 5 - විගණන, අතිරේක බදු රැස් කිරීම්, ආපසු ගෙවීම්, අය කිරීම් ක්‍රියාමාර්ග සහ අභියාචනා ....................30**
5.1 විගණන ....................30
5.2 අභියාචනා ....................30
5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් පසු විගණන ....................31
5.4 අය ක්‍රියා මාර්ග ....................31
5.5 ආපසු ගෙවීම් ....................31
**III කොටස ....................34**
**පරිච්ඡේදය 6 - ජාත්‍යාන්තර සබඳතා ....................34**
6.1 ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම් ....................34
6.1.1 ද්විත්ව බදු ගිවිසුම් සහ බහුපාර්ශවීය ගිවිසුම් පිළිබඳ තොරතුරු ....................34
6.1.2 2012 වර්ෂය තුළ දී ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු ....................35
6.2 විදේශයන්හි පැවති අන්තර් ජාතික බදු කාර්යයන් සඳහා සහභාගිත්වය: ....................36
**පරිච්ඡේදය 7 - ව්‍යවස්ථා සම්පාදනය ....................37**
7.1 වර්ෂය තුළ දී පහත සඳහන් ව්‍යවස්ථාවන් පැනවීම සිදුකරන ලදි. ....................37
7.2 අනුමත පුණ්‍යායතන ....................37
7.3 ගැසට් නිවේදන ....................37
7.4 අර්ථ නිරූපණ කමිටුව ....................37
**පරිච්ඡේදය 8 - අනෙකුත් කාර්යයන් ....................39**
8.1 බදු සේවා අංශය ....................39
8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිශ්කාෂණ සහතික පිළිබඳ විස්තර පහත දැක්වේ. ....................39
8.3 විශ්ලේෂණාත්මක වාර්තා ....................40

**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු**

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු සහ අදාළ අණ පනත් පහත දැක්වේ:

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බද්ද | 2007අංක 10, 2008 අංක 9 සහ 2009 අංක 19 සහ 2011 හා 2012 අංක: 8 දරණ පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත |
| එකතු කළ අගය මත බද්ද, (මූල්‍යමය සේවා මත වූ එකතු කළ අගය මත බද්ද, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බද්ද විකල්ප එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) | 2003අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08 සහ 49, 2007 අංක 14, 2008 අංක 15 2009 , අංක 15 සහ 2011 අංක 09 සහ 2012 අංක 7 පනත් මගින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරණ එකතු අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තු | 2007අංක 15, 2008 අංක 11 2009 ,අංක 16 හා 2011 අංක 11 සහ 2012 අංක 11 දරණ පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009අංක 32 සහ 2011 අංක 10 සහ 2012 අංක 9 දරණ පනත් මගින් සංශෝධිත 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බද්ද | 1988අංක 40 දරණ ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982අංක 43 දරණ මුද්දර ගාස්තු පනත, සංශෝධිත පරිදි 2008 අංක 10 සහ 2011 අංක 13 දරණ පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගණුදෙනු බද්ද | 2005අංක 05 දරණ මුදල් පනත සහ 2007 අංක 13 දරණ මුදල් පනත |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005අංක 5 දරණ මුදල් පනත, 2006 අංක 11 දරණ මුදල් පනත සහ 2008 අංක 08 දරණ මුදල් පනත |
| සමාජ වගකීම් බද්ද | |
| පිරිවැටුම් බද්ද ( උතුරු පළාත) | 1981අංක 69 දරණ පිරිවැටුම් බද්ද, සංශෝධිත පරිදි |

කලින් පනවනු ලැබ දැනට අවලංගු කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් තක්සේරු සහ අය කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 1991අංක 52 දරණ ජාතික ආරක්ෂක බද්ද, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996අංක 34 දරණ භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1996අංක 5 දරණ ජාතිය රැක ගැනීමේ දායක බද්ද, සංශෝධිත පරිදි |
| ධන බද්ද මත අධිභාරය | 1982අංක 25 දරණ ධන බද්ද අධිභාර පනත සහ 1989 අංක 8 දරණ පනත |
| ආදායම් බදු මත අධිභාරය | 1982අංක 26 දරණ අදායම් බදු මත අධිභාර පනත, 1984 අංක 12 දරණ පනත, 1989 අංක 7 දරණ පනත සංශෝධිත පරිදි |
| හර බද්ද | 2003 අංක 05, 2008 අංක 12, 2009 අංක 17 සහ 2011 අංක 14 යන පනත් මගින් සංශෝධිත 2002 අංක 16 දරණ හර බදු පනත |
| බූදල් බද්ද | සංශෝධිත පරිදි 1980 අංක 13 දරණ බූදල් බදු පනත |

# I කොටස - මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

## පරිච්ඡේදය 1 - මානව සම්පත්

### 1.1 අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු.

2012 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ යෙදී සිටි සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

**2012 12.31.දිනට දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 6 | 6 | - |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 5 | 5 | - |
| කොමසාරිස් | 22 | 22 | 0 |
| නියෝජ්‍ය කොමසාරිස් | 90 | 87 | 3 |
| ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | 750 | 69 | 126 |
| තක්සේරුකරු | | 555 | |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි | 1000 | 521 | 469 |
| බදු නිලධාරි | | 10 | |
| <u>ඒකාබද්ධ සේවා</u> | | | |
| අධ්‍යක්ෂ(පරිපාලන) | 1 | 1 | - |
| ගණකාධිකාරී | 8 | 5 | 3 |
| පරිපාලන නිලධාරී | 3 | 3 | - |
| භාෂා පරිවර්තක | 9 | 8 | 1 |
| පුස්තකාලයාධිපති | 2 | 1 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 606 | 494 | 112 |
| අයවැය සහකාර | 2 | 2 | - |
| ප්‍රවාහන නිලධාරි | 1 | - | 1 |
| රියදුරු | 74 | 74 | - |
| කා.සේ.සේ. | 319 | 291 | 28 |
| <u>අනෙකුත්</u> | | | |
| ඉංජිනේරු | 1 | 1 | - |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | - | 1 |
| නි. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 6 | 4 | 2 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 12 | 6 | 6 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 30 | 16 | 14 |
| පද්ධති පරිපාලන | 3 | 3 | - |
| පද්ධති ක්‍රියාකරු | 3 | 3 | - |
| දත්ත සටහන් ක්‍රියාකරු | 8 | 8 | - |
| පිළිගැනීමේ නිලධාරි | 4 | 4 | - |
| සැපයුම් සහකාර | 2 | - | 2 |
| මුද්දර සුරක්ෂිතාගාර සහකාර | 1 | - | 1 |
| තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | - | 1 |
| ගබඩාකරු | 2 | 0 | 2 |
| වඩු කාර්මික | 1 | 1 | 0 |
| **එකතුව** | **2978** | **2203** | **775** |

## 1.2 උසස් කිරීම්

- ❖ 2012 මැයි 22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට උසස් කරන ලදී.
- ❖ 2012 සැප්තැම්බර් 07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්.එම්.සී.අයි. ගුණසේකර මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට උසස් කරන ලදී.
- ❖ 2012 මැයි 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ.ඒ.ජී. අබේරත්න මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ❖ 2012 සැප්තැම්බර් 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩී.බී. ජයසේකර මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ❖ 2012 මැයි 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ. ධර්මසේන මහතා කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ❖ 2012 සැප්තැම්බර් 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්.එම්.ජී. විජේසිංහ මහතා කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව බී.ඒ.ඩී.සී. හේරත් මිය, ඩී.බී. දිසානායක මහතා සහ ඒ.ඩී.එන්.පී. කෝරලේ ආරච්චි මහතා කොමසාරිස් ධූරයන්ට උසස් කරන ලදි.
- ❖ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් හය දෙනෙකු නියෝජ්‍ය කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ❖ තක්සේරුකරුවන් හතර දෙනෙකු ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු ධූරයට උසස් කරන ලදි.

## 1.3 විශ්‍රාම ගැනීම්

පහත සඳහන් නිලධාරීන් වසර තුළ දී විශ්‍රාම ගැනීමට යෙදුනි.

| | |
|---|---|
| • කේ.එල්.එස්. සිල්වා මහතා | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • එච්.එම්. අබේසිංහ මහතා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • කේ.එච්.එන්. සී. පෙරේරා මහතා | කොමසාරිස් |
| • පී.එන්. ආබෲ මහත්මිය | කොමසාරිස් |

**අනෙකුත් විශ්‍රාම ගැනීම්**

| | |
|---|---|
| • නියෝජ්‍ය කොමසාරිස් | 3 |
| • ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | 5 |
| • තක්සේරුකරු | 6 |
| • ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී | 1 |
| • රාජ්‍ය කළමනාකරණ සහකාර | 16 |
| • රියදුරු | 6 |
| • කාර්යාල සේවක සේවය | 13 |

**<u>කේ.එල්.එස්. සිල්වා මහතා</u>**

කේ.එල්.එස්. සිල්වා මහතා 1978 දෙසැම්බර් මස 01 වන දින තක්සේරුකරුවෙකු වශයෙන් දෙපාර්තමේන්තුවට සම්බන්ධ විය. විවිධ තනතුරුවල දැඩි කැපවීමකින් සේවය කළ ඔහු 2010 වසරේදී ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ජනරාල් ධූරයට පත් විය. දේශීය ආදායම් සේවයේ වසර 34 ක කාලපරිච්ඡේදය අවසන් කළ ඔහු 2012 මැයි 21 වැනි දින සේවයෙන් විශ්‍රාම ගියේය. සිල්වා මහතා තම ධූර කාලය තුල පුහුණු වැඩ සටහන් කිහිපයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව නියෝජනය කළේය. එනම්; 1986 ජපානයේ පැවති බදුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය, 2000 වර්ෂයේ වියානා හි පැවති බදු ආකෘති

සම්මන්ත්‍රණය (Tax Modeling Seminar) සහ 2010 වර්ෂයේ කොරියාවේ FMEP යටතේ පැවති ස්වයංක්‍රිය ආදායම් පරිපාලන සහ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධති පාඨමාලාව.

**<u>එච්.එම්. අබේසිංහ මහතා</u>**

එච්.එම්. අබේසිංහ මහතා 1980 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවට බැඳුනු අතර, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුර දක්වා උසස්වීම් ලැබ ඇත. 2012 සැප්තැම්බර් 12 වන දින ඔහු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි. තම ධූර කාලය තුළ පුහුණු වැඩ සටහන් කිහිපයක් මෙන්ම 1986 ජපානයේ පැවති බදුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය, 2006 වර්ෂයේ සිංගප්පූරුවේ පැවති මූල්‍ය බදු පිළිබඳ සම්මන්ත්‍රණය, 2006 වර්ෂයේ ඉන්දියාවේ පැවති සංවර්ධනය වෙමින් පවත්නා රටවල බදු ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රායෝගික ගැටළු සහ බදු පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණය වැනි බදු සම්බන්ධ විදේශීය වැඩ සටහන් කිහිපයකට ද සහභාගී වී ඇත.

## 1.4 විනය ක්‍රියා මාර්ග

| සේවා ගණය | දිනට 2012.01.01 ඉතිරිව තිබුසිද්ධීන් ගණන | වර්ෂය තුළ ආරම්භ කරන ලද සිද්ධීන් ගණන | වර්ෂය තුල අවසන් කළ සිද්ධීන් ගණන | දිනට නිම 2012.12.31 කිරීමට ඉතිරිව තිබූ සිද්ධීන් ගණන |
|---|---|---|---|---|
| තක්සේරුකරු | 7 | 3 | 1 | 9 |
| බදු නිලධාරි | - | - | - | - |

## 1.5 පුහුණු කිරීම

### 1.5.1 අභ්‍යන්තර පුහුණුව

දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය තක්සේරුකරුවන් සහ බදු නිලධාරින් සඳහා නිරන්තර පුහුණු පාඨමාලා හා විභාග පවත්වනු ලැබේ. විශේෂයෙන්ම බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳව ඔවුන්ගේ දැනුම දියුණු කිරීමත්, විශ්ලේෂණාත්මක හැකියාවන් නංවාලීමත් මෙමඟින් අපේක්ෂා කෙරේ. නිලධාරින් ඔවුන්ගේ අදාළ ශ්‍රේණිවල ස්ථිර කිරීමට අවශ්‍ය විවිධ සේවා අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කරනු ලබන විෂයයන් අරමුණු කර මෙම පුහුණු පාඨමාලා සකසා ඇත. 2012 වර්ෂයේ දී පුහුණු අංශය නවම් මාවතේ පිහිටි නව ගොඩනැගිල්ලකට රැගෙන යන ලදි.

වසර තුළ පුහුණු කරන ලද සහ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පරීක්ෂණවල විස්තර පහත දැක්වේ.

- **තක්සේරුකරුවන් සඳහා පුහුණුව**

| පාඨමාලාවපරීක්ෂණය/ | පුහුණු වූ සංඛ්‍යාව | |
|---|---|---|
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පුහුණු පංති | 60 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පුහුණු පංති | 464 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පුහුණු පංති | පළමු වර<br>දෙවන වර<br>තෙවන වර | 464<br>380<br>114 |

- **බදු නිලධාරින් සඳහා පුහුණුව**

| පාඨමාලාවපරීක්ෂණය/ | පුහුණු වූ සංඛ්‍යාව |
|---|---|
| II ශ්‍රේණියේ III පංතියේ බදු නිලධාරින් II ශ්‍රේණියේ III පංතියේ ස්ථිර කිරීම සඳහා අවසාන දෙපාර්තමේන්තු පරීක්ෂණය | 01 |

➢ **සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය**

| විෂය | වසර තුලදී පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩ මුළු සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| ණය වවුචර් විගණනය | 01 | 170 |
| IFRS වෙත ඒකරාශී වීම පිළිබඳ බදු ගම්‍යාර්ථය | 01 | 363 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳ බදු විගණනය | 01 | 60 |
| එකතු කළ අගය මත බදු සංශෝධන | 01 | 120 |

## 1.5.2 විදේශ පුහුණුව

බදු පරිපාලකයින් වශයෙන් නිලධාරින්ගේ වෘත්තීයමය මට්ටම පවත්වාගෙන යාම සඳහා බදු පරිපාලනයේදී වෙනත් රටවල් ලබා ඇති ඉහළ මට්ටම වෙත කාර්ය මණ්ඩලය වෙත ආවරණය කිරීමේ පරමාර්ථය ඇතිව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනෙක් සඳහා විදේශයන්හි පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළුවලට සහභාගි වීමේ අවස්ථාව සලසා දීම සඳහා කටයුතු කරන ලදි. ඒ අනුව, නිලධාරින් 23 දෙනෙකු වසර තුලදී විදේශ පුහුණුවීම් වැඩ සටහන් සඳහා සහභාගි වූහ. එසේ විදේශයන් සඳහා යවනු ලැබූ එම නිලධාරින්ගේ හා සහභාගි වූ පුහුණු වැඩ සටහන් ආදිය පිළිබඳවද විස්තර පහත දැක්වේ.

| | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහනේ/ සම්මන්ත්‍රණයේ වැඩමුළුවේ නම | පුහුණුව ලැබූ රට | කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | එම්.එම්.ඩී.අයි. ගුණසේකර මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු සේවා පිළිබඳ දකුණු ආසියාතික සමුළුව (SAARC) | නේපාලය | 2012.11.25 - 2012.11.28 |
| 2 | කේ. දහනායක මිය ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ආසියාතික බදු පරිපාලකයින්ගේ සම්මන්ත්‍රණය - බදුකරණය පිළිබඳ නීති ප්‍රති වැළකීම සමබරතාව පවත්වා ගැනීම | මලයාසියාව | 2012.09.03 - 2012.09.05 |
| 3 | ඩබ්ලිව්. අනුලාවතී මිය කොමසාරිස් | බදු සේවා පිළිබඳ දකුණු ආසියාතික සමුළුව (SAARC ) | නේපාලය | 2012.11.25 - 2012.11.28 |
| 4 | ඒ.එන්. ගුරුගේ මහතා කොමසාරිස් | E.O.I පිළිබඳ විශ්ව සංසද පුහුණුව සවිසුරු සමාලෝචනය පිළිබඳ ඵලදායී වැඩපිළිවෙල | පිලිපීනය | 2012.09.23 - 2012.09.26 |
| 5 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා කොමසාරිස් | E.O.I පිළිබඳ විශ්ව සංසද පුහුණුව සවිසුරු සමාලෝචනය පිළිබඳ ඵලදායී වැඩපිළිවෙල | පිලිපීනය | 2012.09.23 - 2012.09.26 |
| 6 | කේ.එස්.බී.ආර්.ඩී.එස්. කරුණාරත්න මහතා කොමසාරිස් | බදු පරිපාලකයින්ගේ පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව - 33 වන වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | මෝල්ටා | 2012.10.12 - 2012.10.16 |
| 7 | ඔ.පී.පී.කේ. සිරිසේන මහතා කොමසාරිස් | E.O.I පිළිබඳ විශ්ව සංසද පුහුණුව සවිසුරු සමාලෝචනය පිළිබඳ ඵලදායී වැඩපිළිවෙල | පිලිපීනය | 2012.09.23 - 2012.09.26 |
| 8 | කේ. ධර්මසේන මහතා කොමසාරිස් | මූල්‍ය වෙළඳපොළ පිළිබඳ බදුකරණය - LHDNM - IBFD | මලයාසියාව | 2012.10.28 - 2012.11.01 |
| 9 | ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා කොමසාරිස් | බදු සේවා පිළිබඳ දකුණු ආසියාතික සමුළුව (SAARC ) | නේපාලය | 2012.11.25 - 2012.11.28 |
| 10 | ජේ.ඒ.පී. මහින්දරත්න මහතා නියෝජ්‍ය කොමසාරිස් | ඉස්ලාමීය බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ පාඨමාලාව | ඉන්දුනීසියාව | 2012.04.15 - 2012.04.17 |

| | | | | |
|---|---|---|---|---|
| 11 | ටී.ජී.ඩී.එච්. ජයවර්ධන මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන - පිරික්සුම් වාර්තාව | තායිලන්තය | 2012.09.10<br>-<br>2012.09.22 |
| 12 | ඕ.ඩබ්.එන්. ගුණසේකර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ බදුකරණය සම්බන්ධයෙන් වන වැඩමුළුව | මලයාසියාව | 2012.05.13<br>-<br>2012.05.31 |
| 13 | එන්.එම්.එම්. මිෆ්ලි මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | ව්‍යාපෘති ඇගයීම සහ අවදානම් කළමනාකරණය | අමෙරිකා එක්සත් ජනපදය | 2012.05.12<br>-<br>2012.06.07 |
| 14 | එම්.ඩබ්.එස්. වික්‍රමසිංහ මහතා නියෝජ්‍ය කොමසාරිස් | ප්‍රති මුදල් මාරුකිරීම සහ බදු මගහැරීම | මලයාසියාව | 2012.05.02<br>-<br>2012.05.06 |
| 15 | එම්.පී.එස්. අබේරත්න මහතා නියෝජ්‍ය කොමසාරිස් | බහු ජාතික ව්‍යවසාය සඳහා ජාත්‍යන්තර බදු සැලසුම්කරණය | නෙදර්ලන්තය | 2012.07.18<br>-<br>2012.07.19 |
| 16 | කේ.ජී.එස්. රාජිනී මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ බදුකරණ වැඩමුළුව | මලයාසියාව | 2012.05.13<br>-<br>2012.05.31 |
| 17 | ජී.එන්. ආරියතිලක මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | බදු ගිවිසුම් පිළිබඳ භාවිතය සහ සාකච්ඡා පිළිබඳ හඳුන්වාදීම LHDNM - OECD | මලයාසියාව | 2012.09.30<br>-<br>2012.10.11 |
| 18 | ජේ.ඒ.ආර්. පෙරේරා මහතා<br>නියේජ්‍ය කොමසාරිස් | බදු ගිවිසුම් පිළිබඳ භාවිතය සහ සාකච්ඡා පිළිබඳ හඳුන්වාදීම LHDNM - OECD | මලයාසියාව | 2012.09.30<br>-<br>2012.10.11 |
| 19 | ඩබ්.එස්. තිලකරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | බදු විශ්ලේෂණය සහ ආදායම් පුරෝකථනය - DUKE | අමෙරිකා එක්සත් ජනපදය | 2012.06.22<br>-<br>2012.07.18 |
| 20 | ජේ.එම්.එස්.එස්. රත්නවර්ධන මහතා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | පොදු රාජ්‍ය මණ්ඩලීය බදු අර්ථ නිරූපණ පාඨමාලාව | එක්සත් රාජධානිය | 2012.07.29<br>-<br>2012.08.06 |
| 21 | එම්.ඒ. ප්‍රියංක මහතා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | බදු විශ්ලේෂණය සහ ආදායම් පුරෝකථනය - DUKE | අමෙරිකා එක්සත් ජනපදය | 2012.06.22<br>-<br>2012.07.18 |
| 22 | පී.ජී. රොහාන් කුමාර මහතා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | කළමනාකරණ විභවයන් වෙත ළඟාවීම. | එක්සත් රාජධානිය | 2012.07.29<br>-<br>2012.08.06 |
| 23 | එස්.ඩබ්.ඩී. ප්‍රේමදාස මහතා<br>බදු නිලධාරී | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන - පිරික්සුම් වාර්තාව | තායිලන්තය | 2012.09.10<br>-<br>2012.09.22 |

# II කොටස - බදු පරිපාලනය

## පරිච්ඡේදය 2 - ආදායම් රැස් කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය තුළදී රු. 443,455,765,090/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත (මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ ගිණුම්ගත වන සමාජ වගකීම් බද්ද, පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලැබූ ජාතිය ගොඩනැගීමේ බද්දේ රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත්ව).

### 2.1 බදු ගෙවන්නන් සංඛ්‍යාව (ලිපිගොනු සංඛ්‍යාව)

2012 වර්ෂය අවසාන වන විට බදු ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව අංක 01 වගුවෙහි දක්වා ඇත.

**වගුව 01 - 2012.12.31 දිනට බදු ගෙවන්නන් සංඛ්‍යාව සහ බදු ලිපිගොනු සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| **ආදායම් බද්ද** | | |
| <u>**සංස්ථාපිත**</u> | | |
| වාසික සමාගම් | 31,536 | |
| නිර්වාසික සමාගම් | 550 | |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු ආයතන | 54 | **32,140** |
| <u>**සංස්ථාපිත නොවන**</u> | | |
| පුද්ගලයින් | 174,627 | |
| හවුල් ව්‍යාපාර | 16,169 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 809 | |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තියන් (2012.03.31 දිනට) * | 533,877 | **725,482** |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **757,622** |
| <u>අනෙකුත් බදු ගෙවන්නන්</u> | | |
| **ආර්ථික සේවා ගාස්තුව** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 7,189 | |
| **එකතු කළ අගය මත බදු** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 32,124 | |
| **මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 164 | |
| **වෛකල්පිත එකතු කළ අගය මත බදු** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 4,595 | |
| **ජාතිය ගොඩ නැගීමේ බද්ද** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 91,702 | |
| **ඔට්ටු බදු** ලිපිගොනු සංඛ්‍යාව | 1,051 | |
| **සූදු බදු** ලිපිගොනු සංඛ්‍යාව | 4 | |
| **මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **136,829** |
| උ.වි.ගෙ. යටතේ ලියාපදිංචි වූ **සේවා යෝජකයන්** | 10,083 | |
| **පොළිය මත රඳවා ගත් බදු** (රඳවා ගැනීම් බදු නියෝජිතයන්) | 1,841 | |
| **නිශ්චිත ගාස්තු මත රඳවා ගත් බදු** (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවන්) | 4,669 | |
| **ඉදිකිරීම් කර්මාන්ත ඇප ආරක්ෂණ අරමුදල් බද්ද** | 230 | |
| මුද්දර බදු ( විධිමත් කාර්තුමය උපලේඛන සැපයුම් කරුවන්) | 7,585 | **24,408** |
| **2012.12.31 දිනට සමස්ත ලිපිගොනු / බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **918,859** |

* සේවා යෝජකයින් විසින් සපයන ලද අසම්පූර්ණ ප්‍රකාශනවල සේවා නියුක්තිකයින් ගණන අඩංගු නොවේ.

**සටහන:**

(i) වෙනත් ආදායමක් නොමැති උ.වි.ගෙ. ක්‍රමය යටතේ පාරිශ්‍රමිකයෙන් බදු අඩු කර ගත් යම් සේවා නියුක්තිකයෙකු සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුවෙහි වෙනම ලිපිගොනුවක් පවත්වාගෙන යනු නොලැබේ.

(ii) අවසාන බද්දක් ලෙස ප්‍රභවය මත ආදායම් බදු අය කරනු ලබන පුද්ගලයින් (තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය, ලාභාංශ ආදිය) මෙහි ඇතුළත් කොට නොමැත.

(iii) ඉහත ආදායම් බදු ලිපිගොනු අතර රාජ්‍ය නොවන සංවිධාන සඳහා ලිපිගොනු 227 ක් ද ඇතුලත් වේ.

## 2.2 මුළු ආදායම් රැස් කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස් කිරීම රුපියල් මිලියන 443,456 ක් විය. එය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මි.374 ක හිඟයක් (0.08%) ක් පෙන්නුම් කරයි. ඇතැම් බදු වර්ග අහෝසි කිරීමෙන් (හර බද්ද, ආර්ථික සේවා ගාස්තු, සමාජ වගකීම් බද්ද) ඇතැම් අංශවලට බදු නිදහස් කිරීම් ලබාදීමත් (විශේෂ ව්‍යාපෘති යටතේ ඉදි කිරීම්, උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති ආදිය) ආනයන අඩුවීම, සහනදායී බදු අනුපාත පැනවීම, සරල එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම වැනි කරුණු හේතුකොටගෙන ප්‍රධාන වශයෙන්ම වර්ෂය තුළ දී බදු ආදායමේ පිරිහීමක් පෙන්නුම් කරයි.

ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා වර්ෂය තුළ දී ජාතිය ගොඩනැගීමේ බද්දෙන් රු.මි.13,352/- ක වැඩි ආදායමක් රැස්කරන ලදි. ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත තොග සහ සිල්ලර වෙළඳාම එකතු කිරීමෙන් ජාතිය ගොඩනැගීමේ බද්දේ විෂය පථය පුළුල් කිරීම මෙයට හේතු විය හැකි ය.

රජයේ ආදායමට වර්ෂය තුළ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 44.89% ක් විය. අදාළ ඇස්තමේන්තුගත කිරීම් සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායම්වල මුළු රැස්කිරීම 98.85% ක් වූයේ සුළු ආන්තික පහළ යාමක් පමණක් පෙන්නුම් කරමිනි.

කෙසේ වුවද, ආදායම් බදු රැස්කිරීම් පෙර වර්ෂයට වඩා 16% කින් ඉහළ ගොස් ඇත. පසුගිය වර්ෂය හා සසඳන විට පොළී මත රඳවාගැනීමේ බදු රැස් කිරීම් වර්ෂය තුළ දී ඉහළ ගොස් ඇත.

අදාල ඇස්තමේන්තු සහ එක් එක් බදු වර්ගයේ රැස් කිරීම්වල අගයන් 02 වගුවේ සංසන්දනාත්මකව දක්වා ඇති අතර, 01 සටහනෙහි ද දක්වා ඇත. වර්ෂය තුළ දී මුල්‍ය ප්‍රවාහය 03 වගුවේ දක්වා ඇති අතර, එය 01 සටහන මගින් විස්තරාත්මකව දක්වා ඇත.

## වගුව 02 - මුළු ආදායම රැස්කිරීම - 2012

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව රු. (සංශෝධිත ) | ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීම් ඇස්තමේන්තුවේ % ලෙස | රැස් කිරීම් මුළු ආදායමේ % ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බදු | 159,985,000,000 | 157,728,902,903 | 98.59% | 35.57% |
| ආර්ථික සේවා ගාස්තුව | 17,318,000,000 | 14,864,241,267 | 85.83% | 3.35% |
| හර බද්ද | - | (481,999) | | 0.00% |
| ඔට්ටු හා සූදු බද්ද | 312,000,000 | 289,175,098 | 92.68% | 0.07% |
| කොටස් ගණුදෙනු බද්ද | 2,200,000,000 | 1,285,744,429 | 58.44% | 0.29% |
| එකතු කළ අගය මත බද්ද | 223,961,000,000 | 204,656,032,805 | 91.38% | 46.15% |
| භාණ්ඩ හා සේවා බද්ද | 18,000,000 | 11,994,674 | 66.64% | 0.00% |
| පිරිවැටුම් බද්ද | 25,000,000 | 138,260,169 | 553.04% | 0.03% |
| ජාතික ආරක්ෂක බද්ද | 4,000,000 | 3,930,354 | 98.26% | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 950,000,000 | 709,648,933 | 74.70% | 0.16% |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 43,753,190,000 | 57,105,793,114 | 130.52% | 12.88% |
| මුද්දර බද්ද | - | 6,535,304,353 | | 1.47% |
| **සමාජ වගකීම් බද්ද** | 200,000,000 | 127,218,990 | 63.61% | 0.03% |
| **මුළු ආදායම (සමාජ වගකීම් බද්ද ඇතුළුව)** | **448,726,190,000** | **443,455,765,090** | **98.83%** | **100.00%** |

* පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් - රු.18,369,640,750.00

** පළාත් සභාවලට මාරු කරන ලද මුද්දර බදු රැස්කිරීම් - රු.6,535,304,353.00

*** මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මාරු කරන ලද සමාජ ආරක්ෂණ බදු රැස්කිරීම් රු.127,218,990.00



## 2.3 මුළු ආදායම – මුදල් ප්‍රවාහය

| වගුව 03 - මුදල් ගලනය - 2012 | | |
|---|---|---|
| මාසය | ආදායම් රැස් කිරීම් (ස.ව.බ. ඇතුළුව) රු. | සමුච්චිත ආදායම් රැස් කිරීම් රු. |
| ජනවාරි | 42,075,707,441.00 | 42,075,707,441.00 |
| පෙබරවාරි | 38,333,272,961.00 | 80,408,980,402.00 |
| මාර්තු | 30,918,629,787.00 | 111,327,610,189.00 |
| අප්‍රේල් | 39,878,481,178.00 | 151,206,091,367.00 |
| මැයි | 40,703,956,087.00 | 191,910,047,454.00 |
| ජූනි | 31,465,449,849.00 | 223,375,497,303.00 |
| ජූලි | 34,440,719,404.00 | 257,816,216,707.00 |
| අගෝස්තු | 41,861,114,634.00 | 299,677,331,341.00 |
| සැප්තැම්බර් | 38,481,041,717.00 | 338,158,373,058.00 |
| ඔක්තෝබර් | 34,840,722,276.00 | 372,999,095,334.00 |
| නොවැම්බර් | 40,135,654,330.00 | 413,134,749,664.00 |
| දෙසැම්බර් | 26,267,547,878.00 | **443,455,765,090.00** |

සටහන 02
මුදල් ගලනය - 2012



| බදු වර්ගය | 2012<br>ආදායම් රැස් කිරීම්<br>රු. | 2011<br>ආදායම් රැස් කිරීම්<br>රු. | Increase/ decrease of Collection as a % |
|---|---|---|---|
| ආදායම් බදු | 157,728,902,903 | 135,973,513,529 | 16.00 |
| ආර්ථික සේවා ගාස්තුව | 14,864,241,267 | 21,335,091,270 | -30.33 |
| හර බද්ද | (481,999) | 4,232,322,781 | -100.01 |
| ඔට්ටු හා සූදු බද්ද | 289,175,098 | 286,881,858 | 0.80 |
| කොටස් ගණුදෙනු බද්ද | 1,285,744,429 | 3,263,518,189 | -60.60 |
| එකතු කළ අගය මත බද්ද | 204,656,032,805 | 215,419,828,725 | -5.00 |
| භාණ්ඩ හා සේවා බද්ද | 11,994,674 | 25,543,709 | -53.04 |
| පිරිවැටුම් බද්ද | 138,260,169 | 130,615,686 | 5.85 |
| ජාතික ආරක්ෂක බද්ද | 3,930,354 | 14,743,435 | -73.34 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 709,648,933 | 1,106,035,868 | -35.84 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 57,105,793,114 | 53,501,015,453 | 6.74 |
| මුද්දර බද්ද | 6,535,304,353 | 7,217,344,951 | -9.45 |
| **සමාජ වගකීම් බද්ද** | 127,218,990 | 1,323,560,600 | -90.39 |
| **මුළු ආදායම (සමාජ වගකීම් බද්ද ඇතුළුව)** | **443,455,765,090** | **443,830,016,054** | **-0.08** |

## 2.4 මුද්දර සහ ජාතිය ගොඩ නැගීමේ බදු ආදායම පළාත් සභාවලට මාරුකිරීම.

2012 අයවැය යෝජනා වලට අනුකූලව පනවා ඇති අදාල ව්‍යවස්ථා සම්පාදනයන් ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා රැස්කරනු ලබන පහත සඳහන් බදු වර්ගයන් පළාත් සභාවලට මාරු කරන ලදි.

පළාත් සභාවලට මාරුකරන ලද මුදල සහ දෙපාර්තමේන්තුව විසින් අදාල බදුවල මුළු රැස්කිරීම් ප්‍රමාණය 04 වගුවේ දැක්වේ.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු | රැස්කිරීම් වලින් 33.33% ක් |
| මුද්දර බදු | රැස්කිරීම් වලින් 100% ක් |

**වගුව 04:- පළාත් සභාවලට බදු ආදායම් මාරු කිරීම -2012**

| | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය (රු.) | මුළු එකතුව (රු.) |
|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු | 18,369,640,750.00 | 57,105,793,114.00 |
| මුද්දර බදු | 6,535,304,353.00 | 6,535,304,353.00 |

## 2.5 ආදායම් රැස් කිරීම් – ස්වතක්සේරු පදනම සහ අනෙකුත්

වර්ෂය තුළදී මුළු ආදායම් රැස්කිරීම් වලින් (ආනයන මත එකතු කළ අගය මත බදු හා ආනයන මත ජාතිය ගොඩ නැගීමේ බදු හැර) 4% ක් රැස්කරන ලද්දේ ස්වතක්සේරු නොවන අදායම් වශයෙනි. 2011 වසරේ දී මෙම අගය මුළු ආදායම් රැස් කිරීමෙන් 3.48% ක් විය. ස්වේච්ඡා අනුකූලතාවය දිරි ගන්වමින් බදු රැස්කිරීම දෙපාර්තමේන්තු මෙහෙවරේ ප්‍රධාන අංගයක් වන බැවින් ස්වතක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා සියලු ප්‍රයත්නයන් දරා තිබේ. මෙකී කාර්යය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අවශ්‍ය පහසුකම් ද අඛණ්ඩව සපයා දෙනු ලැබේ. මෙම සංසන්දනාත්මක අගයන් 05 වගුවේ දක්වා ඇත.

| වගුව 05 :- ස්වතක්සේරු පදනම යටතේ සහ වෙනත් රැස්කිරීම් සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2010 (රු.'000) | | 2011 (රු.'000) | | 2012 (රු.'000) | |
| | ස්වතක්සේරු | වෙනත් | ස්වතක්සේරු | වෙනත් | ස්වතක්සේරු | වෙනත් |
| ආදායම් බද්ද | 110,451,338 | 7,123,922 | 130,990,294 | 4,983,219 | 152,640,354 | 5,088,549 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ.රහිතව) | 115,100,917 | 4,884,494 | 98,826,247 | 4,283,614 | 101,816,629 | 3,370,532 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ.රහිතව) | 18,981,744 | 328,332 | 27,950,249 | 609,927 | 30,496,246 | 3,233,290 |
| අනෙකුත් | 38,642,159 | 709,105 | 38,132,720 | 802,937 | 23,485,987 | 479,049 |
| **එකතුව** | **283,176,158** | **13,045,853** | **295,899,510** | **10,679,697** | **308,439,216** | **12,171,420** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බදු රහිතව) | 95.60% | 4.40% | 96.52% | 3.48% | 96% | 4% |

## 2.6 රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දායකත්වය

2012 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය හා රාජ්‍ය ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය හා එහි ඉකුත් වසර 04 ක ප්‍රවණතාවය 06 වගුවෙන් දැක්වේ. අංක 03 සටහන මගින් දායකත්වය නිරූපණය කර ඇත. 2012 වසරේ රාජ්‍ය ආදායම රුපියල් මිලියන 987,844 ක් (මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, වාර්ෂික වාර්තාව - 2012) දක්වා වැඩි වී ඇත්තේ රාජ්‍ය ආදායමට මුළු දේශීය ආදායම් රැස් කිරීම්වල ප්‍රතිශතය 44.90% ක් ලෙස වාර්තා කරමිනි.

| වගුව 06:- ප්‍රධාන ආර්ථික ක්‍රියාවන්හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රාජ්‍ය ආදායමට දේශීය ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය | පවත්නා මිල ගණන් ප්‍රධාන ආර්ථික ක්‍රියාවන්හි දේශීය ආදායම් රැස් කිරීමේ % රු. මිලියන * | දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය |
| 2008 | 655,260 | 344,570 | 52.59% | 4,410,682 | 7.81% |
| 2009 | 699,643 | 353,015 | 50.46% | 4,835,293 | 7.30% |
| 2010 | 817,280 | 422,512 | 51.69% | 5,604,104 | 7.54% |
| 2011 | 934,812 | 443,830 | 47.48% | 6,544,009 | 6.78% |
| 2012 | 987,844 | 443,456 | 44.90% | 7,582,376 | 5.85% |

මූලාශ්‍රය – * ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව) **මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (වාර්ෂික වාර්තාව)



## 2.7 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් බදු වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්වතක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් වරප්‍රසාද වර්ෂය පුරාම ක්‍රියාත්මක විය. කාඩ්පත් සඳහා සුදුසුකම් ලැබීම, (රන් කාඩ්පත් සහ රිදී කාඩ්පත්) තනි පුද්ගල බදු ගෙවන්නන් සඳහා යම් යම් ප්‍රතිලාභයන් වන වරප්‍රසාද කාඩ්පත් සඳහා සුදුසුකම් ලැබීම, (රන් කාඩ්පත් සහ රිදි කාඩ්පත්) මෝටර් රථ ආනයන මත බදු සහන ප්‍රදානය කිරීම, කලින් ගෙවීම් කරන බදු සම්බන්ධයෙන් වට්ටම් ලබාදීම ආදිය මගින් බදු නීතිය කෙරෙහි ස්වේඡා අනුකූලතාවය ඉහළ නැංවීම අඛණ්ඩව සිදුකරන ලදි.

ඒ අනුව, පූර්ව වර්ෂයන් හා සැසඳීමේ දී 2011/2012 තක්සේරු වර්ෂයන් තුළ නියමිත දිනෙන් මසක් ඇතුළත සංස්ථාපිත අංශයේ ආදායම් බදු වාර්තා සම්පූර්ණ කිරීම පසුගිය වසරේ පැවති 56% ක අගයට සාපේක්ෂව මේ වසරේ 60% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ සංස්ථාපිත අංශයේ ආදායම් බදු වාර්තා සම්පූර්ණ කිරීම 65% ක් විය. සංස්ථාපිත නොවන අංශයේ එය නියමිත දිනට 39% ක් වූ අතර, නියමිත දිනෙන් මාසයක් තුළ එය 48% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් දළ බදු වාර්තා සම්පූර්ණ කිරීමේ අනුකූලතාව 51% ක් විය.

07 වගුව මගින් 2007/08 සිට 2011/12 වර්ෂවල නියමිත දිනට සහ නියමිත දින සිට මාසයක් ඇතුළත ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වා දෙයි. 08 වගුව මගින් අනෙකුත් බදු සම්බන්ධව වාර්තා සැපයීමේ අනුකූලතාවය පෙන්වයි.

**වගුව 07 :- ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය 2007/08 සිට 2011/2012 දක්වා**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට මාසයක් ඇතුළත අනුකූලතාවය |
|---|---|---|---|
| 2007/2008 | සංස්ථාපිත | 37% | 55% |
| | සංස්ථාපිත නොවන | 27% | 50% |
| 2008/2009 | සංස්ථාපිත | 49% | 58% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |
| 2009/2010 | සංස්ථාපිත | 52% | 66% |
| | සංස්ථාපිත නොවන | 41% | 53% |
| 2010/2011 | සංස්ථාපිත | 56% | 68% |
| | සංස්ථාපිත නොවන | 42% | 59% |
| 2011/2012 | සංස්ථාපිත | 56% | 60% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |

**වගුව 08 :- අනෙකුත් බදු වාර්තා සැපයීම් අනුකූලතාවය**

| | එකතු කළ අගය මත බදු | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | උපයන විට ගෙවීම් | |
|---|---|---|---|---|---|
| වසර 2010 | 94% | 81% | 98% | තක්සේරු වර්ෂ 2009/10 | 51% |
| වසර 2011 | 94% | 85% | 89% | තක්සේරු වර්ෂ 2010/11 | 63% |
| වසර 2012 | 89% | 80% | 79% | තක්සේරු වර්ෂ 2011/12 | 52% |

## 2.8 ආදායම් බදු රැස්කිරීම

සංස්ථාපිත ආදායම් බදු, පුද්ගල ආදායම් බදු සහ පොළී මත රඳවාගැනීමේ බදු වලින් ආදායම් රැස් කිරීම 2012 වසරේ රුපියල් මිලියන 157,728 කි. 2011 වර්ෂයේ පැවති රුපියල් මිලියන 135,973 ට සාපේක්ෂව 16% ක වැඩිවීමකි.

සමාගම්වල ලාභාංශ ප්‍රකාශ කිරීම සහ බෙදාහැරිය හැකි ලාභ වැඩිවීම, බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රවල පොළී අනුපාත හා ආයෝජන ඉහළ යාම සහ වර්ෂය තුළ දී ප්‍රේෂණ බද්දක් වශයෙන් සාමාන්‍යය ඉක්මවා ගිය ආදායමක් ලැබීම මේ සඳහා හේතු සාධක වේ. කෙසේ වුවද සේවා අංශයේ අපේක්ෂිත ආදායම් වර්ධනය ළඟා කර ගැනීම නොහැකිවීම හේතු කොටගෙන සංස්ථාපිත අංශයේ ආදායම් බදු ආදායම එකතු කිරීමේ පසුබෑමක් සිදු විය.

ආදායම් බද්ද දෙපාර්තමේන්තුවෙහි මුළු ආදායමෙන් 36.20% ක් ලෙස වූ අතර, එය 2011 වසරේ දී 30.72% ක් විය.

### 2.8.1 වර්ෂය ඇතුළත ආදායම් බද්දට අදාළව සිදුකර ඇති ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

බදු නිදහස් කිරීම්/ සහනදායී අනුපාතයන් යටතේ බදුකරණය

2015 මාර්තු 31 දිනට පෙරාතුව ආයෝජනය කිරීමට යටත්ව, පහත දක්වා ඇති ඕනෑම ක්‍රියාකාරකමක නිරතවන නව ව්‍යවසායන් සඳහා ද භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් දේශීය බදු විරාම තන්ත්‍රය ව්‍යාප්ත කර ඇත.

i. කෘෂිකර්මය හා / හෝ කෘෂි සැකසීම්
ii. සත්ව පාලනය හා / හෝ සකස් කිරීම
iii. මසුන් ඇල්ලීම හා / හෝ මසුන් සකස් කිරීම
iv. තොරතුරු තාක්ෂණය
v. ව්‍යාපාර / දැනුම් ක්‍රියාදාමයන් බාහිරින් ලබාගැනීම
vi. සෞඛ්‍ය සේවා
vii. අධ්‍යාපනය
viii. රූපලාවන්‍ය කටයුතු
ix. ශීත කාමර සහ ගබඩා
x. සංචාරක කර්මාන්තය
xi. ක්‍රීඩා සහ ශරීර සුවතා මධ්‍යස්ථාන
xii. කලා කටයුතු ඇතුලු නිර්මාණශීලී කටයුතු
xiii. කුඩා ජල විදුලිබල ව්‍යාපෘති

නිශ්චිත ක්‍රියාකාරකම් හි නිරත වන ව්‍යවසායන් ආයෝජනයේ ප්‍රමාණය අනුව බදු විරාමයන් සඳහා සුදුසුකම් ලබයි. ආයෝජනයේ ප්‍රමාණය අනුව හිමිකම් ලබන බදු විරාම කාලය පහත පරිදි වේ.

| ආයෝජන | | | බදු විරාමය |
|---|---|---|---|
| රු. මිලියන 300 | - | රු. මිලියන 500 | වසර 6 |
| රු. මිලියන 500 | - | රු. මිලියන 700 | වසර 7 |
| රු. මිලියන 700 | - | රු. මිලියන 1000 | වසර 8 |
| රු. මිලියන 1,000 | - | රු. මිලියන 1,500 | වසර 9 |
| රු. මිලියන 1,500 | - | රු. මිලියන 2,500 | වසර 10 |
| රු. මිලියන 2,500 ට වැඩි | | | වසර 12 |

i. බෝට්ටු, ඖෂධ, ටයර් සහ ටියුබ්, මෝටර් රථ අමතර කොටස්, ලී බඩු, සෙරමික්, වීදුරු භාණ්ඩ හෝ වෙනත් ඛනිජ ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන, රබර් ආශ්‍රිත නිෂ්පාදන, විලවුන් නිෂ්පාදන, දේශීයව වගා කරන ලද කෘෂි නිෂ්පාදන ආශ්‍රයෙන් නිෂ්පාදිත ආහාර නිෂ්පාදන, ඉදි කිරීම් අමුද්‍රව්‍ය හෝ විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ නිෂ්පාදනය කිරීම;
ii. මුළු නිෂ්පාදනයෙන් සියයට අනූවකට නොඅඩු ප්‍රමාණයක් සහ, ඇඟලුම් සම්බන්ධයෙන් වනවිට මුළු නිෂ්පාදනයෙන් සියයට හැත්තෑ පහකට නොඅඩු ප්‍රමාණයකින් සංයුක්ත විය යුතු, වක්‍ර අපනයනය ද ඇතුලුව, අපනයනය සඳහා සම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනය කිරීම, සෑදීම හෝ සැකසීම;
iii. ආහාර බෝග හෝ කාර්මික බෝග වගා කිරීම;
iv. උද්‍යාන වගාව;
v. වන වගාව;
vi. කිරි නිෂ්පාදනය, කුකුළන්, ඌරන්, එළුවන් ආදී සතුන් හා සම්බන්ධ සත්ත්ව පාලනය;
vii. ගෙවීම්වල මුළු වටිනාකමින් සියයට හැත්තෑවකට නොඅඩු ප්‍රමාණයක්, පරිවර්තනය කළහැකි විදේශ ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබිය යුතු වූ සේවාවන් ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට සැපයීම;
viii. සංචාරක ව්‍යාපාරය හෝ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ව්‍යාපෘති;
ix. හෝටල්, ආගන්තුක නිවාස හෝ සමාන සේවාවන්;
x. වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම ඇතුලුව යටිතල පහසුකම් ව්‍යාපෘති;
xi. බඩු ගබඩා සහ ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම;
xii. පුනර්ජනනීය සම්පත් භාවිතයෙන් විදුලිබල උත්පාදනය;

xiii. කාර්මික ජනපද, විශේෂිත ආර්ථික කලාප හෝ දැනුම් පුරවර පිහිටුවීම;
xiv. නාගරික නිවාස හෝ නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය;
xv. සනීපාරක්ෂක සේවා හෝ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සැපයීම;
xvi. ජල සැපයුම් සේවා සංවර්ධනය කිරීම;
xvii. අභ්‍යන්තර ජල මාර්ග සංවර්ධනය කිරීම හෝ ඒ ආශ්‍රිත (භාණ්ඩ හෝ මගීන්) ප්‍රවාහන කටයුතු;
xviii. ආරෝග්‍ය ශාලා ඉදිකිරීම සහ සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැලසීම;
xix. ගුවන් යානා හෝ සමුද්‍රීය යාත්‍රා අලුත්වැඩියා කිරීම හෝ නැව් කැඩීම;
xx. ක්‍රීඩා සේවා (උදාහරණ: මෝටර් රථ ධාවන තරඟ හෝ ගොල්ෆ් ක්‍රීඩා පිටි) ;
xxi. තොරතුරු තාක්ෂණය;
xxii. මෘදුකාංග සංවර්ධනය;
xxiii. ව්‍යාපාර හෝ දැනුම් ක්‍රියාවලිය බහිර් අර්පණය කිරීම;
xxiv. සැහැල්ලු හෝ බර ඉංජිනේරු කර්මාන්තයේ යම් ව්‍යාපෘතියක්;
xxv. ගවයන් කෘත්‍රිම සිංචනය කිරීම (කිරි නිෂ්පාදන සංවර්ධනය);
xxvi. අධ්‍යාපන සේවා සැපයීම ; හෝ
xxvii. ජාතික ආර්ථිකයේ සංවර්ධනය සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාකාරකමක්;

**සහනදායී බදු අනුපාතයන්**

(a) **විශේෂිත බැංකු ශාඛාවන් මගින් කරනු ලබන සංවර්ධන කටයුතු -** සංවර්ධන බැංකු කටයුතු සම්බන්ධයෙන්ම අලුතින් පිහිට වූ වාණිජ බැංකු ශාඛාවක ලාභ සහ ආදායම් සියයට 24 ක් වන අඩු අනුප්‍රමාණයකින් බද්දට යටත් කෙරේ.

(b) **පර්යේෂණ හා වැඩිදියුණු කිරීම -** පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 16 ක උපරිමයකටත් සමාගමක් සම්බන්ධයෙන් සියයට 20.

(c ) **අගය එකතු කළ "තේ" -** ශ්‍රී ලාංකික වෙළඳ නාමයකින් අගය වැඩි කිරීමක් සහිතව පිරිසිදු ශ්‍රී ලංකා **තේ** (සිලොන් ටී) අපනයනය කිරීම සඳහා, අපනයනකරුවෙකු සමඟ බද්ධ ව්‍යාපාරයක් ස්ථාපනය කර ඇති, වගාකරුවෙකු ද වන තේ නිෂ්පාදකයෙකු, හෝ තේ නිෂ්පාදකයෙකු එකී බද්ධ ව්‍යාපාරය සඳහා මිළදී ගත් තේ ප්‍රමාණයට ආරෝපණය කළහැකි නිෂ්පාදන ආදායම් ප්‍රමාණය මත සියයට 12 බදු අනුප්‍රමාණයකට හිමිකම් ලැබ ඇත.

(d) **අත් යන්ත්‍ර රෙදි කර්මාන්තය -** දේශීය අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදනයේ නිරත පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 12 ක උපරිමයකටත් සමාගමක් සම්බන්ධයෙන් සියයට 12.

(e) **සෞඛ්‍ය සේවා -** පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 12 ක උපරිමයකටත් සමාගමක් සම්බන්ධයෙන් සියයට 12.

**අනිකුත් බදු නිදහස් කිරීම**

(අ) ආයතන:

(i) ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ;
(ii) ළමා ආරක්ෂණ අධිකාරියේ;

ලාභාංශ හා පොළී ආදායම් නොවන ලාභ ආදායම් බද්දෙන් නිදහස් කරන ලදි.
(දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය සංශෝධනය කර ඇත.)

(ආ) අදායම් ප්‍රභවයන් අනුව නිදහස් කිරීම

(i) ශ්‍රී ලංකාවෙන් පිටත රටකින් ලැබෙන රාජ්‍ය භාග, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම් එකී රාජ්‍ය භාග බද්දෙන් නිදහස් වනු ඇත.

(ii) ඒකක භාර හෝ අනොන්‍ය අරමුදලක ඒකක නිදහස් කර ගැනීමෙන් උද්ගතවන ලාභ සහ ආදායම්.

(iii) ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට දෙනු ලබන ණයක් මත, ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට උපචිත වන පොළී.

(iv) ක්‍රීඩාංගන, ක්‍රීඩාගාර හෝ ක්‍රීඩා සංකීර්ණ පරිපාලනයෙන් උද්ගත වන ලාභ හා ආදායම්

(v) ශ්‍රී ලංකාවට ගෙන්වන ලද, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන ක්‍රීඩා පුහුණුකරුවකුගේ එම සේවය සඳහා ලබන ලාභ සහ ආදායම.

### 2.8.2 ආදායම් බදු රැස් කිරීම් - අංශ වශයෙන් වර්ගීකරණය කිරීම

සමස්ත ආදායම් බදු රැස්කිරීමෙන් (රුපියල් මිලියන 157,728) රුපියල් මිලියන 77,054 ක් හෝ සමස්ථ ආදායම් රැස්කිරිම 49% ක් සංස්ථාපිත අංශය මගින් ලැබුණ අතර, 51% ක් වූ රුපියල් මිලියන 80,674 ක ප්‍රමාණයක් සංස්ථාපිත නොවන අංශයෙන් ලැබිණි. එම ආදායම් බදු රැස්කිරීමෙහි සංයුතිය 09 වගුව නිරූපණය කරන අතර, සටහන 05 මගින් විස්තර කර ඇත.

**වගුව 09 : - සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස් කිරීම් - 2012 සහ 2011**

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත * | 77,054,016,253.00 | 49% | 77,412,806,959.00 | 57% |
| සංස්ථාපිත නොවන** | 80,674,886,650.00 | 51% | 58,560,706,570.00 | 43% |
| එකතුව | **157,728,902,903.00** | **100%** | **135,973,513,529.00** | **100%** |

සටහන * 2011 රු. මිලියන 7,157 ක් හා 2012 රුපියල් මිලියන 8,712 ක් වශයෙන් ලාභාංශ බදු ඇතුළත් ය.

** සංස්ථාපිත අංශය මගින් ඉටු කරන ලද සේවාවන්ගෙන් සහ උ.වි.ගෙ යෝජනා ක්‍රමය යටතේ සේවා නියුකුතිකයන් විසින් ගෙවනු ලබන ආදායම් බදුවලින් අඩු කර ප්‍රේෂණය කරන ලද රඳවා ගැනීමේ බදු මෙහි ඇතුළත්ය.

**සටහන 04**
**සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස් කිරීම්**
**2012 සහ 2011**




### 2.8.3 ආදායම් බදු රැස්කිරීම - ප්‍රභවය අනුව වර්ගීකරණය

ආදායම් බදු රැස්කිරීම්වල ප්‍රභවය අනුව (සේවා නියුක්තිය සහ අනෙකුත්) වර්ගීකරණය 10 වන වගුව මගින් දැක්වේ.

| වගුව 10 :- ආදායම් බදු රැස් කිරීම - 2012 | | |
|---|---|---|
| **ප්‍රභවය** | **රැස් කිරීම (රු.මිලියන)** | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ.ක්‍රමය | 14,729.43 | |
| ස්වතක්සේරු සහ දණ්ඩන සමග තක්සේරු | 49.83 | **14,779.26** |
| **වෙනත්** | | |
| ස්වතක්සේරු සහ දණ්ඩන සමග තක්සේරු | 74,839.51 | |
| පොළී හා වාර්ෂික රාජ්‍යභාග හෝ කළමනාකරණ ගාස්තු ගෙවීමේදී අඩු කරගන්නා ලද බදු | 59,624.52 | |
| ප්රභවයේදී අනෙකුත් අඩු කිරීම් | 8,769.01 | |
| **දළ එකතුව** | | **143,233.04** |
| අඩු කළා : ආපසු ගෙවීම් | | (283.40) |
| **ශුද්ධ රැස් කිරීම්** | | **157,728.90** |

## 2.9 එකතු කළ අගය මත බදු රැස් කිරීම

වර්ෂය තුල එකතු කළ අගය මත බදු රැස්කිරීම වන රුපියල් මිලියන 204,656 අගය 2011 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 10,763 ක සහ වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල වන රුපියල් මිලියන 223,961 ට සාපේක්ෂව රුපියල් මිලියන 19,304 ක පහළ යාමකි. කෙසේ වුවද, එකතු කළ අගය මත බදු රැස් කිරීම්වලින් කොටසක් වන දේශීය සැපයුම්කරුවන්ගෙන් එක්රැස් කරගන්නා ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව සුළු වැඩිවීමක් පෙන්නුම් කරන ලදි. ආනයන මත වර්ෂය තුළ දී රැස් කරගන්නා ලද එකතු කළ අගය මත බදුවල ප්‍රබල පසුබෑමක් පෙන්නුම් කර ඇත. වර්ෂය තුළ රැස් කරගන්නා ලද මුළු එකතු කළ අගය මත බදු වටිනාකම රුපියල් මිලියන 105,187 ක් වූ අතර, මෙම මුදල 2011 වර්ෂයේ දී මුළු වටිනාකම වූ රුපියල් මිලියන 103,109 ක් වූ මුදලට සාපේක්ෂව රුපියල් මිලියන 2077 ක වැඩි වීමකි. 2011 වර්ෂයේ දී රැස් කරන ලද මුළු එකතු කළ අගය මත බදු වටිනාකම රුපියල් මිලියන 112,309 ක් වූ අතර, එය 2012 වර්ෂයේ දී රුපියල් මිලියන 99,468 ක් විය. වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු ආදායම අඩු වීමට හේතු සාධක වූ ඇතැම් කරුණු ලෙස, ආනයනික භාණ්ඩ ප්‍රමාණය අඩු වීම, විශේෂ එකතු කළ අගය මත බදු ක්‍රමය හඳුන්වාදීම (මෙම ක්‍රමය යටතේ අපනයනකරුවන් එකතු කළ අගය මත බදු ගෙවීම අවශ්‍ය නොවිය.) ඇතැම් භාණ්ඩ සඳහා බදු නිදහස් කිරීම් ලබාදීම, විශේෂ ව්‍යාපෘති ආදිය දැක්විය හැකිය.

### 2.9.1 එකතු කළ අගය මත බද්දට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

(අ) ආනයනය කිරීම් නිදහස් කිරීම, (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

- ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් සිනමාශාලා වැඩිදියුණු කිරීම සඳහා වන ශබ්ද විකාශන යන්ත්‍ර හා ඇම්ප්ලිෆයර්ස්, ශ්‍රව්‍ය සංඛ්‍යාත විද්‍යුත් වර්ධක හා උපාංග, සිනමා මාධ්‍ය උපකරණ හා ඩිජිටල් උපකරණ
- ඖෂධ නිෂ්පාදකයින් විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍රෝපකරණ සහ උපාංග
- ජෛවස්කන්ධ කැට සහ තැටි නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන යන්ත්‍ර සූත්‍ර
- සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගම, මිහින් ලංකා (පුද්ගලික) සමාගම, එයාර් ලංකා කේටරින් සර්විසස් සමාගම වැනි ජාත්‍යන්තර ප්‍රවාහන සේවාවන්හි සේවා සැපයීමේ කාර්ය සඳහා අවශ්‍ය කෙරෙන භාණ්ඩ
- දේශීය පරිභෝජනය සඳහා රෙදිපිළි
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචිය ක්‍රියාත්මක කරන කාලපරිච්ඡේදය තුළ 16 ඇ සහ 18 අ වගන්ති යටතේ ආදායම් බද්දෙන් නිදහස් වීම සඳහා යන්ත්‍ර සූත්‍ර හෝ උපකරණ ආනයනය කරනු ලබන පිරියත
- හරිතාගාර හා පොලිටනල්ස් සහ හරිතාගාර ඉදිකිරීම සඳහා හා පොලිටනල්ස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය වගාකරුවන් විසින් ආනයනය කිරීම.

(ආ) **සැපයුම:**

දේශීය නිෂ්පාදනය කළ:

- ජල විදුලිබල උත්පාදනය සඳහා යොදාගනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ
- ටර්බයින
- ටින් මාළු හෝ මැටි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයා විසින් සැපයීම
- දේශීයව එකතු කළ අගය සහිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හැකිවන පරිදි, සංචාරක හෝටල් සහ ගුවන් සේවා සඳහා අවශ්‍ය වන ප්‍රමිතීන්ට අනුකූලව, දේශීයව නිෂ්පාදනය කළ අමුද්‍රව්‍ය භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ
- හඳුනාගත් රාජ්‍ය ආයතන විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවට ආදේශනය කරනු ලබන දේශීයව නිෂ්පාදිත භාණ්ඩ
- පර්යේෂණ හා සංවර්ධන සේවා
- වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්
- චිත්‍ර ශිල්පීන් විසින් ඔවුන්ගේ චිත්‍ර නිර්මාණ සැපයීම
- අපනයන සංවර්ධන අරමුදලින් ගෙවනු ලබන අපනයන සංවර්ධන ප්‍රතිපාදනයන් යම් අන්තර් ජාතික කටයුත්තක් ශ්‍රී ලංකාව තුළ පැවැත්වීමෙන් රටට අත්වන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන මුදල් අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද එවැනි අන්තර් ජාතික කටයුත්තක් සඳහා සපයන සේවා
- යම් රෙදිපිළිවල හෝ ඇඟලුම්වල ගුණාත්මක බව, ස්වරූපය හෝ වටිනාකම ඉහළ නැංවීමට ඉවහල් වන සේවා
- දේශීය වහයෙන් නිෂ්පාදිත ෆාම් ඔයිල්

(ඇ) **ආනයනය හෝ සැපයුම්** (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

- ලොරි හා ට්‍රක්, බස් රථ,
- ක්‍රීඩා උපකරණ
- රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ
- ඉරු දැව
- **ඇස් කණ්ණාඩි, ඇස් කණ්ණාඩි රාමු නිෂ්පාදනය** සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය
- අව්කණ්ණාඩි
- සුවඳ විලවුන්
- උදළු හා මුල්ලු
- ආටීමියා - සහ පීට්මොස්
- අච්චු (ලෝහ, වීදුරු, රබර්, ප්ලාස්ටික්)
- කුකුළු කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ සහ උපාංග
- යම් අන්තර්ජාතික කටයුත්තක් ශ්‍රී ලංකාව තුළ පැවැත්වීමෙන් රටට අත්වන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද එවැනි යම් අන්තර්ජාතික කටයුත්තක් සඳහා වන භාණ්ඩ.,

(ඇ) මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද
ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල් සඳහා පොළී, ලාභාංශ හෝ ණය සේවා (dest instrument) මගින් ලැබෙන ලැබීම් හේතුවෙන් එකතු වූ අගය

**එකතු කළ අගය මත විලම්බනය කිරීමේ යෝජනා ක්‍රමය**

සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය (SVAT Scheme) නියමාකාරයෙන් ක්‍රියාවෙහි යෙදවීම සඳහා දැනට පරිපාලනමය වශයෙන් ක්‍රියාවේ යොදවා ඇති සහ බදු ගෙවන්නන් හට දැනටමත් මාර්ගෝපදේශ මගින් සන්නිවේදනය කර ඇති ඇතැම් සංශෝධනයන් එකතු කළ අගය මත බදු පනතට ඇතුළත් කරනු ඇත.

11 වගුව මගින් එකතු කළ අගය මත බදු රැස්කිරීම් වල අංශ වශයෙන් වර්ගීකරණය, ආපසු ගෙවීම් සහ ශුද්ධ රැස් කිරීම් පෙන්නුම් කරන අතර 05 සටහන මගින් එය නිරූපණය කරයි.

**වගුව 11 :- එකතු කළ අගය මත බදුවල දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම්**

| අංශය | 2011 | | 2012 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු.මිලියන) | | දළ රැස් කිරීම් (රු.මිලියන) | | ආපසු ගෙවීම් | ශුද්ධ රැස් කිරීම් (රු.මිලියන) | |
| නිෂ්පාදන අංශය | | 32,824.88 | | 39,789.50 | 1,302.22 | | 38,487.28 |
| නිෂ්පාදන නොවන අංශය | | | | | | | |
| සේවා | 48,474.19 | | 47,354.91 | | 1,847.31 | 45,507.60 | |
| මූල්‍ය සේවා | 21,721.76 | | 21,090.80 | | - | 21,090.80 | |
| වෛකල්පිත එ.අ.බ. | 89.03 | 70,284.98 | 101.48 | 68,547.19 | - | 101.48 | 66,699.88 |
| ආනයන | | 112,309.96 | | 99,468.91 | 0.04 | | 99,468.87 |
| **එකතුව** | | **215,419.82** | | **207,805.60** | **3,149.57** | | **204,656.03** |

**සටහන 05**
එකතු කළ අගය මත බදු රැස් කිරීම්
**2011 සහ 2012**




12 වන වගුව මගින් පෙන්නුම් කරන්නේ එකතු කළ අගය මත බදු අංශ වශයෙන් වර්ගීකරණය කිරීම සහ දළ දේශීය නිෂ්පාදනය සඳහා එහි දායකත්වයයි.

**වගුව 12 :- දළ දේශීය නිෂ්පාදනය සඳහා එ.අ.බ. වල දායකත්වය අංශ වශයෙන් විශ්ලේෂණය කිරීම**

| අංශය | 2011 | | 2012 | | දළ දේශීය නිෂ්පාදනයට එ.අ.බ. ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු.මිලියන) | % | ශුද්ධ රැස් කිරීම් (රු.මිලියන) | % | 2010 | 2011 |
| නිෂ්පාදන අංශය | 32,824,883,451 | 15.24% | 38,487,278,292 | 18.81% | 0.50% | 0.51% |
| නිෂ්පාදන නොවන අංශය | 70,284,977,867 | 32.63% | 66,699,883,293 | 32.59% | 1.07% | 0.88% |
| ආනයන මත | 112,309,967,407 | 52.14% | 99,468,871,220 | 48.60% | 1.71% | 1.31% |
| එකතුව | **215,419,828,725** | **100.00%** | 204,656,032,805 | **100.00%** | **3.29%** | **2.70%** |

### 2.9.2 කර්මාන්ත අනුව විශ්ලේෂණය

13 වගුව මගින් බැංකු, රක්ෂණ, හෝටල් හා ආපන ශාලා, ඉදිකිරීම්, විදුලිය, ගෑස් ආනයනය සහ මූල්‍ය යනාදී වශයෙන් වර්ගීකරණය කරන ලද දේශීයව එකතු කළ අගය මත බදු හා සමස්ත ආදායමට එහි දායකත්වය පෙන්වා ඇත.

| වගුව 13 :- දළ දේශීය එකතු කළ අගය මත බද්ද - නිෂ්පාදන සහ සේවා අංශ | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | 2010 (රු.මිලියන) | 2011 (රු.මිලියන) | පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩුවීමේ/ වැඩිවීමේ ප්‍රතිශතය | 2012 (රු.මිලියන) | පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩුවීමේ/ වැඩිවීමේ ප්‍රතිශතය |
| බැංකු | 21,391 | 14,828 | -30.68% | 14,380 | -3.02% |
| රක්ෂණ | 3,370 | 4,207 | 24.83% | 4,456 | 5.92% |
| හෝටල් සහ ආපන ශාලා | 3,882 | 4,590 | 18.24% | 5,396 | 17.56% |
| ඉදිකිරීම් | 6,077 | 6,828 | 12.36% | 5,871 | -14.02% |
| විදුලිය සහ ගෑස් | 151 | 269 | 78.23% | 570 | 112% |
| ආනයන | 11,914 | 16,103 | 35.16% | 6,949 | -56.85% |
| මූල්‍ය | 13,354 | 11,072 | -17.09% | 10,576 | -4.48% |
| සංනිවේදන | 7,111 | 1,048 | -85.27% | 211 | -79.87% |
| ඛණිජ නිෂ්පාදන | 2,438 | 271 | -88.89% | 269 | -0.74% |
| පාන වර්ග - මත් පැන් | 10,887 | 8,877 | -18.46% | 9,043 | 1.87% |
| වර්ගීකරණය නොකළ සේවා | 7,085 | 7,291 | 2.90% | 7,633 | 4.69% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 6,507 | 7,588 | 16.60% | 7,105 | -6.37% |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද | 25,817 | 20,139 | 21.99% | 32,723 | 62.49% |
| **එකතුව** | **119,985** | **103,110** | **-14.06%** | **105,187** | **2.01%** |

## 2.10 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම.

වර්ෂය තුළදී මුළු ජාතිය ගොඩනැගීමේ බදු රැස් කිරීමේ මුළු ආදායම රුපියල් මිලියන 57,106 ක් වූ අතර, එම මුළු වටිනාකමින් රුපියල් මිලියන 18,370 ක් පළාත් සභා වෙත මාරු කර යවන ලදි. 2012.12.31 දිනය වනවිට ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වී සිටි මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව 91,702 ක් විය. ජා.ගො.බ. සඳහා ලියාපදිංචි වූ බදු **ගෙවන්නන්** අතර, තොග සහ සිල්ලර වෙළඳාම්වල නිරතවන්නන් ද ඇතුළත්ව සිටි බැවින්, වර්ෂය තුළදී ඇස්තමේන්තුගත මුදලට වඩා රුපියල් මිලියන 13,352 කින් ආදායම ඉහළ ගොස් ඇත.

### 2.10.1 ජාතිය ගොඩනැගීමේ බදුවලට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

**නිදහස් කිරීම්:**

(අ) අභ්‍යවකාශ යානා හෝ නැව් ආනයනය කිරීම (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

(ආ) කෘත්‍රිම පාද, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවන ආධාරක සඳහා වන අමතර කොටස්, දෘශ්‍යාබාධිතයින් සඳහා සුදු සැරයටි, බ්‍රේල් ලියන සහ ඒවායේ කොටස් සහ බ්‍රේල් ලියන පත්‍රිකා සහ බෝඩ් ආනයනය කිරීම, (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

(ඇ) සකස් නොකළ දැව කඳන් ආනයනය කිරීම (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

(ඈ) මහන නූල් සහ එළවළු කෙඳි ආශ්‍රිත නූල් හැර අනෙකුත් නූල් ආනයනය කිරීම (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

(ඉ) රෙදි ආනයනය කිරීම (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ)

(ඊ) තොග සහ සිල්ලරට විකිණීම
- 2011.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුද්‍රිත පොත්
- අපනයනකරුවන් සඳහා භාණ්ඩ
- එකතු කරන්නන් විසින් සපයන නැවුම් කිරි, අමු තේ දළු, කුරුඳු සහ රබර් (ලේටෙක්ස්, ක්‍රේප් හෝ ෂීට් රබර්)
- පිරවුම්හලක විකුණන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්

(උ) දේශීයව නිෂ්පාදනය කළ මැටි උළුකැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන එම නිෂ්පාදකයා විසින් විකිණීම

(ඌ) චිත්‍ර නිර්මාණකරුවෙකු විසින් තම චිත්‍ර විකිණීම

| වගුව 14 :- ජා.ගො.බ. රැස්කිරීම් විශ්ලේෂණය - 2012 | | |
|---|---|---|
| අංශය | ශුද්ධ රැස් කිරීම් (රු.) | |
| | 2011 | 2012 |
| නිෂ්පාදන | 10,085,470,339 | 11,617,896,700 |
| සේවා | 18,474,705,865 | 22,111,639,351 |
| ආනයන | 24,940,839,249 | 23,376,257,063 |
| **එකතුව** | **53,501,015,453** | **57,105,793,114** |

| වගුව 15 :- ඇස්තමේන්තුව සමග ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
| 2012 | 65,629,785,000 | 57,105,793,114 | 87% |
| 2011 | 51,112,500,000 | 53,501,015,453 | 105% |




## 2.11 ආර්ථික සේවා ගාස්තු රැස් කිරීම

වර්ෂය තුළ දී ආර්ථික සේවා ගාස්තු ලෙස දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද මුදල රුපියල් මිලියන 14,864 ක් වූ අතර, මුළු රැස්කිරීම් සඳහා එහි දායකත්වය 3.5% ක් විය. වර්ෂය සඳහා ඇස්තමේන්තු අගය හා ගත් කල එය 85.83% ක වර්ධනයකි.

| වගුව 16 :- ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
| 2012 | 17,318,000,000 | 14,864,241,267 | 86% |
| 2011 | 21,072,700,000 | 21,335,091,270 | 101% |



### 2.11.1 ආර්ථික සේවා ගාස්තු වලට අදාළව ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්වීම්

**නිදහස් කිරීම්**

- ලාභ ආදායම් බද්දට යටත් වන ඕනෑම ව්‍යාපාරයක පිරිවැටුම ආර්ථික සේවා ගාස්තු බදු බැඳියාවෙන් ඉවත් කිරීමෙන්, ආර්ථික සේවා ගාස්තු ගෙවීමේ බැඳියාව තවදුරටත් ලිහිල් කරනු ඇත. ඒ අනුව, යම් තක්සේරු වර්ෂයක් තුළ ආදායම් බදු ගෙවීමෙන් නිදහස්වීම හෝ අලාභ ලැබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් නොවන ව්‍යාපාරයක පිරිවැටුම මත පමණක් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ.
- දේශීයව නිෂ්පාදනය කළ මැටි උළුකැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයා විසින්ම විකිණීම.

ආර්ථික සේවා ගාස්තු සඳහා බදු බැඳියාවෙන් නිදහස් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 25 සිට රුපියල් මිලියන 50 දක්වා වැඩි කරනු ලැබ ඇත.

## 2.12 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම

වර්ෂය තුළ උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ රැස්කරන ලද දළ ආදායම රුපියල් මිලියන 14,779 ක් වන අතර 2011 එය රුපියල් මිලියන 14,818 කි.

උපයන විට ගෙවීම් ක්‍රමය යටතේ සේවා නියුක්තිකයින් 533,877 ක් ආදායම් බදු ගෙවන බවට වාර්තා වූ අතර (ඇතැම් සේවා යෝජකයින් විසින් ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ ප්‍රකාශනවල සේවකයින් සංඛ්‍යාව ඇතුළත් නැත.) උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ සේවායෝජකයින් 10,083 ක් ලියාපදිංචි වී තිබුණි.

**වගුව 17:- උපයන විට ගෙවීමේ බදු සහ ආදායම් මට්ටම් විශ්ලේෂණය කිරීම**

| ආදායම් පරාසය (රුපියල්) | | සමස්ත දළ පාරිශ්‍රමිකය (රුපියල්) | සේවා නියුක්තිකයින් සංඛ්‍යාව | උ.වි.ගෙ. යටතේ ගෙවන ලද බදු (රුපියල්) |
|---|---|---|---|---|
| 600,000 ට අඩු | බදු අඩු නොකළ | | | |
| | බදු අඩු කළ | 86,794,446,890 | 388,512 | 162,475,454 |
| 600,001-1,100,000 | | 76,983,570,548 | 96,090 | 964,814,262 |
| 1,100,001-1,600,000 | | 37,316,054,305 | 29,460 | 1,112,996,868 |
| 1,600,001-2,100,000 | | 15,140,301,666 | 8,457 | 768,814,832 |
| 2,100,001-2,600,000 | | 8,939,694,416 | 3,848 | 624,676,974 |
| 2,600,001-3,600,000 | | 15,909,638,651 | 3,394 | 991,012,270 |
| 3,600,000 ට වැඩි | | 30,168,498,466 | 4,116 | 5,365,005,074 |
| **එකතුව** | | **271,252,204,942** | **533,877** | **9,989,795,733** |

*සටහන : 2011/2012 තක්සේරු වර්ෂය මත පදනම්ව සේවා යෝජකයින් විසින් ඉදිරිපත් කළ සම්පූර්ණ කරන ලද වාර්තාවලට අනුව ඉහත තොරතුරු සපයා ඇත.*

## 2.13 රඳවාගැනීමේ බදු

පොළිය මත රඳවාගැනීමේ බදු රැස්කිරීම වර්ෂය තුළදී රුපියල් 59,262,107,756 ක් වූ අතර, එකී රැස්කිරීම්වලින් රු49,415,264,431 ක්.රජයේ සුරැකුම්පත් වලින් ද (2011 වසර සඳහා රු.27,385,287,097), රු.8,790,601,147/- ක් මූල්‍ය ආයතනවලින් ද, ඉතිරිය අනෙකුත් උපකරණ වලින් ද ලැබුණි. පොළී මත රඳවාගැනීමේ බදු ආදායම පෙර වර්ෂයට වඩා රුපියල් මිලියන 25,861 කින් වැඩි වූ අතර, එය මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමට වඩා රුපියල් මිලියන 6,688 ක වැඩි වීමකි. රජයේ සුරැකුම්පත් මත පොළී ආදායම වර්ෂය තුළ දී ඉහළ ගොස් ඇත. සාපේක්ෂව

14.7% ක ඉහළ යාමකි. රජයේ සුරකුම්පත්වලින් පොළී ආදායම වසර තුළ ඉහළ ගොස් තිබුණි. පුද්ගලයින් සහ පුණ්‍යායතන සඳහා නිදහස් කිරීමේ සීමාව රු.500,000 දක්වා ඉහළ යාම සහ අනුප්‍රමාණයෙන් 10% සිට 8% දක්වා අඩුවීම හේතුවෙන් මූල්‍ය ආයතන මගින් රැස්කිරීම් අඩු විය.

වාර්ෂික රාජ්‍යභාග හෝ කළමනාකරණ ගාස්තු ගෙවීමේ දී අඩුකිරීම් ලෙස රැස්කරන ලද මුදල රුපියල් 344,211,910 ක් විය. (2011 වසර සඳහා මෙම වටිනාකම රු.4,384,168,264 ක් විය.) කුලී, බදුකුලී හෝ වෙනත් සමාන ගෙවීම්වලින් වන නිශ්චිත ගාස්තු මත වන රඳවාගැනීමේ බදු තවදුරටත් ක්‍රියාත්මක නොවූ බැවින් එසේ ලැබුණු රඳවාගැනීමේ බදු ආදායම අඩු විය.

## 2.14 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම්.

වර්ෂය තුල ඔට්ටු හා සූදු බදු රැස්කිරීම් ප්‍රමාණය රුපියල් 289,175,098/- ක් විය. වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අගය හා සසඳා බැලීමේ දී මෙයින් රු.22,824,902/- ක අඩුවීමක් පිළිබිඹු විය.
2011 සහ 2012 වර්ෂ තුළ දී ඔට්ටු හා සූදු බදු රැස්කිරීම එහි ඇස්තමේන්තු ගත අගය සමඟ සසඳා 18 වගුවේ දක්වා ඇත.

**වගුව 18 :- ඔට්ටු හා සූදු බදු රැස් කිරීම්**

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | තත්‍ය රැස් කිරීම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2012 | 312,000,000.00 | 289,175,098.00 | 92.68% |
| 2011 | 300,000,000.00 | 286,881,858.00 | 95.63% |




## 2.15 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම.

2012 වසර තුල ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ආදායම් රැස්කිරීම රු. 709,648,933/- ක්, බදු ගෙවන්නන් 230 ක් ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී තිබුණි.

19 වගුව ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්දෙහි ආදායම් ඇස්තමේන්තුව 2011 සහ 2012 වසරවල රැස්කරන ලද ආදායම සමඟින් සංසන්දනය කරයි.

| වගුව 19 :- ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | තත්‍ය රැස් කිරීම (රු.) | ප්‍රතිශතය |
| 2012 | 950,000,000.00 | 709,648,933.00 | 75% |
| 2011 | 949,272,000.00 | 1,106,035,868.00 | 116.5% |

## 2.16 මුද්දර බදු රැස්කිරීම

මුද්දර බදු ලෙස රුපියල් මිලියන 6,535 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරණ පළාත් සභා (මුද්දර බදු එකතු කිරීම) පනත ප්‍රකාරව මුද්දර බදු රැස්කිරීම් සම්පූර්ණ ප්‍රමාණය පළාත් සභාවලට මාරුකරන ලදි. බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂණ හමු පවත්වන ලද අතර, ඒ අනුව 2012 වසර තුළ ස්ථාන 174 නිරීක්ෂණයට ලක් විය. සමථායන නියෝජිතයන් 7579 ක් මුද්දර බදු සඳහා විධිමත්ව ලියාපදිංචිව තිබූ අතර, (2012.12.31 දිනට) ඒ අතරින්7574 උපලේඛන ඉදිරිපත් කොට තිබුණේ 100% අනුකූලතාවයක් වාර්තා කරමිනි.

## 2.17 2008 සිට 2012 දක්වා දේශීය ආදායම් රැස් කිරීම්

2008 සිට 2012 වසර දක්වා ආදායම් රැස් කිරීම් බදු වර්ග අනුව 20 වගුවෙන් නිරූපණය කර ඇත.

| වගුව 20 :- 2008 සිට 2012 දක්වා දේශීය ආදායම් රැස් කිරීම් - බදු අනුව විශ්ලේෂණය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| බදු වර්ගය | 2008 | | 2009 | | 2010 | | 2011 | | 2012 | |
| | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % |
| ආදායම් බද්ද | 112,065 | 32.52 | 125,350 | 35.51 | 117,575 | 27.83 | 135,974 | 30.64 | 157,729 | 35.57 |
| ආර්ථික සේවා ගාස්තු | 14,476 | 4.20 | 14,207 | 4.02 | 18,048 | 4.27 | 21,335 | 4.81 | 14,864 | 3.35 |
| එකතු කළ අගය මත බදු | 202,984 | 58.91 | 171,118 | 48.47 | 219,563 | 51.97 | 215,420 | 48.54 | 204,656 | 46.15 |
| හර බදු | 8,410 | 2.44 | 8,036 | 2.28 | 10,843 | 2.57 | 4,232 | 0.95 | | 0.00 |
| ඔට්ටු හා සූදු බදු | 270 | 0.08 | 269 | 0.08 | 295 | 0.07 | 286 | 0.06 | 289 | 0.07 |
| කොටස් ගණුදෙනු බද්ද | 449 | 0.13 | 560 | 0.16 | 2273 | 0.54 | 3,264 | 0.74 | 1,285 | 0.29 |
| පිරිවැටුම් බද්ද | 535 | 0.16 | 337 | 0.10 | 388 | 0.09 | 131 | 0.03 | 138 | 0.03 |
| මුද්දර බදු | 3,751 | 1.09 | 3,327 | 0.94 | 4,440 | 1.05 | 7,217 | 1.63 | 6,535 | 1.47 |
| භාණ්ඩ හා සේවා බද්ද | 127 | 0.04 | 56 | 0.02 | 39 | 0.01 | 25 | 0.01 | 12 | 0.00 |
| ජාතික ආරක්ෂක බද්ද | 68 | 0.02 | 17 | 0.00 | 23 | 0.01 | 15 | 0.00 | 4 | 0.00 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 230 | 0.07 | 571 | 0.16 | 830 | 0.20 | 1,106 | 0.25 | 710 | 0.16 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 0 | 0.00 | 27,205 | 7.71 | 46,022 | 10.89 | 53,501 | 12.05 | 57,106 | 12.88 |
| සමාජ වගකීම් බද්ද | 1,206 | 0.35 | 1,962 | 0.56 | 2,173 | 0.51 | 1,324 | 0.30 | 127 | 0.03 |
| **රැස්කිරීම් වල එකතුව** | **344,571** | **100.00** | **353,015** | **100.00** | **422,512** | **100.00** | **443,830** | **100.00** | **443,455** | **100.00** |

**සටහන 09**

**2008 සිට 2012 දක්වා දේශීය ආදායම් රැස් කිරීම බදු අනුව විශ්ලේෂණය**



## පරිච්ඡේදය 3 - වියදම් සහ ඵලදායිතා අනුපාතය

වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි මුළු වියදම රුපියල් මිලියන 1,596 වූ අතර, පසුගිය වසරේ අගය වූ රුපියල් මිලියන 1,560 සමඟ සසඳා බැලීමේදී එය 2.34% ක අඩුවීමකි. පුනරාවර්තන වියදම් ප්‍රමාණය රුපියල් මිලියන 1,435 ක් වූ අතර, එය මුළු වියදමින් 98% ක් විය. මෙම අගය 2011 වසරේදී මිලියන 1,435 ක් විය. වේතන සඳහා වූ වියදම 2011 වසරේ පැවති රුපියල් මිලියන 1,110 ට සාපේක්ෂව 8.91% ක ඉහළ යාමකි. මුළු වියදමින් 75.75% ක් සහ පුනරාවර්තන වියදම්වලින් 77.43% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් අයිතමය විය.

2011 වර්ෂය සමඟ සසඳන විට වර්ෂය තුල ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 66.58 % ක අඩුවීමක් වාර්තා කරන ලද අතර, එය 2011 රුපියල් මිලියන 42 ට ළඟා වී ඇත. මෙම අගය 2011 වසරේ දී රුපියල් මිලියන 125 ක් විය. දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් **2.**62% නියෝජනය කරන ලද්දේ ප්‍රාග්ධන වියදමෙනි. (2011 වසරේ දී එය 8% ක් විය.)

### 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම 2010 සහ 2011 සහ 2012 වර්ෂ සමග සැසඳීම

**වගුව 21:- මුළු වියදම - 2010, 2011 සහ 2012**

| විස්තරය | 2010 (රු.'000) | % | 2011 (රු.'000) | % | 2012 (රු.'000) | % |
|---|---|---|---|---|---|---|
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පඩි නඩි | 1,081,102 | 67.68% | 1,110,669 | 71.17% | 1,209,700 | 75.40% |
| ගමන් වියදම් | 7,647 | 0.48% | 15,844 | 1.01% | 24,231 | 1.51% |
| සැපයුම් | 55,603 | 3.48% | 58,217 | 3.73% | 61,851 | 3.86% |
| අළුත්වැඩියා | 21,650 | 1.36% | 24,457 | 1.56% | 33,851 | 2.11% |
| ගිවිසුම්ගත සේවා | 264,372 | 16.55% | 209,962 | 13.45% | 210,813 | 13.14% |
| මාරු කිරීම් | 11,309 | 0.71% | 15,427 | 0.98% | 21,761 | 1.36% |
| වෙනත් | - | 0.00% | - | 0.00% | 60 | 0.00% |
| උප එකතුව | **1,441,684** | **90.25%** | **1,434,576** | **91.94%** | **1,562,267** | **97.38%** |
| <u>ප්‍රාග්ධන වියදම්</u> | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩි දියුණු කිරීම් | 131,178 | 8.21% | 108,142 | 6.93% | 19,893 | 1.24% |
| ප්‍රධාන වත්කම් අත්පත් කර ගැනීම් | 15,636 | 0.98% | 7,717 | 0.49% | 13,875 | 0.86% |
| ධාරිතා ගොඩනැගීම | 8,964 | 0.56% | 9,987 | 0.64% | 8,293 | 0.52% |
| උප එකතුව | **155,778** | **9.75%** | **125,846** | **8.06%** | **42,061** | **2.62%** |
| **එකතුව** | **1,597,462** | **100%** | **1,560,422** | **100%** | **1,604,328** | **100%** |

සටහන 10
මුළු වියදම - 2010, 2011 and 2012



### 3.2 2012 පුනරාවර්තන වියදම් විශ්ලේෂණය

සටහන 11
පුනරාවර්තන වියදම් - 2012




### 3.3 ඵලදායී අනුපාතය

වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් 1,546,944,756/- වූ අතර රැස් කළ ආදායම රුපියල් 443,455,765,090/- ක් විය.. ඵලදායී අනුපාතය (එනම්, වියදම් කළ සෑම රුපියලක් සඳහාම එක් රැස් කළ ආදායම) 278:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රුපියල් 100 ක් රැස් කිරීමේ පිරිවැය ශත 36 කි. රු.100 ක් රැස්කිරීමේ පිරිවැය ආනයන මත එකතු කළ අගය හා ජාතිය ගොඩ නැගීමේ බදු මත බදු රහිතව ගත් කළ ශත 50 කි. (පෙර වර්ෂයේ දී මෙම අගයන් පිළිවෙලින් ශත 35 සහ ශත 50 ක් විය.)

22 වගුවෙහි 2010 සිට 2012 දක්වා ආදායම් රැස් කිරීම් වර්ගීකරණය, සමස්ත වියදම සහ රැස් කිරීමේ පිරිවැය දක්වයි.

**වගුව 22:- ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස් කිරීමේ පිරිවැය (රු.මිලියන)**

| විස්තරය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| ආදායම් රැස් කිරීම | | | |
| ආදායම් බද්ද | 117,575.26 | 135,973.51 | 157,728.90 |
| ආර්ථික සේවා ගාස්තු | 18,047.72 | 21,335.09 | 14,864.24 |
| එකතු කළ අගය මත බද්ද | 219,563.12 | 215,419.83 | 204,656.03 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 46,022.52 | 53,501.01 | 57,105.79 |
| හර බද්ද | 10,843.44 | 4,232.33 | -0.48 |
| ඔට්ටු හා සූදු බද්ද | 294.84 | 286.88 | 289.18 |
| කොටස් ගණුදෙනු බද්ද | 2,272.96 | 3,263.52 | 1,285.74 |
| පිරිවැටුම් බද්ද | 388.29 | 130.62 | 138.26 |
| මුද්දර බද්ද | 4,439.84 | 7,217.34 | 6,535.31 |
| භාණ්ඩ හා සේවා බද්ද | 38.53 | 25.54 | 11.99 |
| ජාතික ආරක්ෂක බද්ද | 23.22 | 14.74 | 3.93 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 829.79 | 1106.04 | 709.65 |
| සමාජ වගකීම් බද්ද | 2,172.63 | 1,323.56 | 127.22 |
| **මුළු එකතුව** | **422,512.16** | **443,830.01** | **443,455.76** |

| | | | |
|---|---|---|---|
| **වියදම්** | | | |
| **<u>පුනරාවර්ථන වියදම්</u>** | | | |
| පඩිනඩි | 1,081.10 | 1,110.67 | 1,209.70 |
| ගමන් වියදම් | 7.65 | 15.84 | 24.23 |
| සැපයුම් හා උපකරණ | 55.6 | 58.22 | 61.85 |
| අළුත්වැඩියා හා නඩත්තු | 21.65 | 24.46 | 33.85 |
| සේවා | 264.37 | 209.96 | 210.81 |
| මාරු කිරීම් | 11.31 | 15.43 | 21.76 |
| වෙනත් | - | - | 0.06 |
| **<u>ප්‍රාග්ධන වියදම්</u>** | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම | 131.18 | 108.14 | 12.51 |
| අත්පත් කර ගැනීම් | 15.64 | 7.72 | 13.87 |
| ධාරිතා ගොඩනැගිලි | 8.96 | 9.98 | 8.29 |
| **මුළු වියදම** | **1,597.46** | **1,560.42** | **1,596.94** |
| | | | |
| **රු.100 ක් රැස් කිරීමේ පිරිවැය** | **0.37** | **0.35** | **0.36** |
| **ආනයන මත එකතු කළ අගය මත හා ජා.ගො.බදු හැර රු.100 ක් රැස් කිරීමේ පිරිවැය** | **0.54** | **0.50** | **0.50** |

## 3.4 අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණන ශාඛාව මගින් සිදු කරන ලද විගණනවලට සියලුම වියදම්, දෛනික වාහන ධාවන සටහන්, (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන) පඩි ලැයිස්තු, වාර්ෂික පරීක්ෂණ මණ්ඩල වාර්තා බැංකු සැසඳුම් ප්‍රකාශන (මහජන බැංකුව, ලංකා බැංකුව, මහ බැංකුව) පරීක්ෂා කිරීම ඇතුළත් විය. තවද, අගරු චෙක්පත්වල මුදල් අය කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග, එකතු කළ අගය මත බදු සහ ආදායම් බදු වලින් සිදුකළ ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ අග්‍රිම මුදල් ගිණුම් පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

## පරිච්ඡේදය 4 - පැහැර හරින ලද බදු

### 4.1 පැහැර හරින ලද බදු

23 වන වගුවෙන් 2012.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණයන්, අත්හිටවූ බදු ප්‍රමාණයන්, දණ්ඩන සහ රැස් කරගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණයන් නිරූපනය කරයි.

**වගුව 23:- 2012.12.31 දිනට පැහැර හරින ලද බදු විශ්ලේෂණය**

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | මුළු දඩ මුදල (රු.) | දඩය හැර පැහැර හරින ලද මුළු බදු ප්‍රමාණය (රු.) | දඩ මුදල හැර මතභේදයට ලක්ව තිබූ බද්ද (රු.) | අය කළ හැකි බද්ද (රු.) | අය කළ හැකි දඩ මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 50,305,401,129 | 30,601,862,973 | 47,012,449,642 | 28,688,759,983 | 3,292,951,487 | 1,913,102,990 |
| ආදායම් බද්ද මත අධිභාරය | 1,038,611,247 | 530,020,286 | 1,038,611,247 | 530,020,286 | - | - |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැ. බදු) | 1,347,860,607 | 598,822,390 | 1,339,164,721 | 587,411,045 | 8,695,886 | 11,411,345 |
| එ.අ.බ. | 57,737,358,566 | 28,871,028,556 | 52,288,968,903 | 25,984,236,596 | 5,448,389,663 | 2,886,791,960 |
| ආ.සේ. /ගා. | 3,613,633,915 | 2,239,728,273 | 3,008,210,797 | 1,933,743,115 | 605,423,118 | 305,985,158 |
| ජා.ගො.බ. | 2,415,077,042 | 996,945,014 | 1,573,451,774 | 685,015,366 | 841,625,268 | 311,929,648 |
| මුද්දර බද්ද | 50,601,512 | 15,783,405 | - | - | 50,601,512 | 15,783,405 |
| පිරිවැටුම් බද්ද | 4,070,801,595 | 1,981,825,235 | 4,070,801,595 | 1,981,825,235 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 1,022,786,741 | 1,101,058,280 | 1,022,786,741 | 1,101,058,280 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 2,619,575,572 | 1,038,781,691 | 2,619,575,572 | 1,038,781,691 | - | - |
| ජා.රැ.ගැ.ආ. | 40,639,820 | 10,803,287 | 40,639,820 | 10,803,287 | - | - |
| ධන බද්ද | 82,010,954 | 506,656 | 82,010,954 | 506,656 | - | - |
| ධන බද්ද මත අධිභාරය | 2,977,627 | - | 2,977,627 | - | - | - |
| ත්‍යාග බද්ද | 14,676,661 | 1,204 | 14,676,661 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 3,552,149 | 196,986 | 3,168,266 | 148,619 | 383,883 | 48,367 |
| අක්‍රීය බද්ද | 18,732,604 | - | 18,732,604 | - | - | - |
| **202 දඩ & 172 දඩ** | - | 291,814,642 | - | 118,704,370 | - | 173,110,272 |

සටහන:

i. එක් එක් බදු වර්ගය යටතේ පවතින සමුච්ඡිත ශේෂයන් ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කරයි. කෙසේ වෙතත් නොගෙවූ බදු ඉහත වර්ගීකරණය කර ඇති ආකාරයට ඒ ස්වරූපයෙන්ම සම්පූර්ණයෙන්ම හිඟව නොපවතී.

ii. තක්සේරුවක් නිකුත් කරන ඕනෑම අවස්ථාවකදී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාවට අනුව නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශන ආදිය ඉදිරිපත් කිරීම) නොගෙවූ මුදලක් හෝ හිඟ මුදලක් ඇතිවීම සිදුවේ. නියමිත දිනට බදු නොගෙවීම සඳහා සාමාන්‍ය දණ්ඩන මුදල 10% ක් වන අතර, ආදායම් බදු සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වෙනතුරු නොගෙවන ලද සෑම මාසයක් වෙනුවෙන්ම 2% ක ප්‍රමාණයක් සහ එ.අ.බ. සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

iii. යම් ඇස්තමේන්තුවකට එරෙහිව අදාළ පාර්ශවයන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති විටෙක සහ ඒ අනුව බදු ගෙවන්නන් විසින් ඔවුන්ගේ අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම් කර ඇති පරිදි නිරාකරණය කිරීම

සිදුකරනු ලබන විටෙක සමහර නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළට අභියාචනා මට්ටම දක්වා එය යොමු කළහැකි ය. (අභියාචන කොමිසම, අභියාචනා අධිකරණය ආදිය.) මෙම හිඟ බදු ප්‍රමාණය විවාදයට බඳුන් වූ බදු හෝ බදු සඳහා වන දණ්ඩන ලෙස වර්ගීකරණය කළහැක. අභියාචනා විසඳීමේ දී දණ්ඩන හා තක්සේරු කරන ලද ඕනෑම අතිරේක බදු ප්‍රමාණයක් විසර්ජනය කළයුතු වේ.

## 4.2 හිඟබදු අඩුකිරීම සඳහා සැලසුම.

(අ) හිඟබදු අයකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ පියවර පිළිබඳ අදාළ ප්‍රඥප්තීන්වල සඳහන්ව ඇත තක්සේරු නිකුත් කිරීම මගින් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබූ නමුත් සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව තිබෙනු දක්නට ලැබේ.

(ආ) 2010 අංක 16 දරණ හිඟ බදු අය කිරීමේ පනතේ (විශේෂ විධිවිධාන) දක්වා ඇති හිඟ බදු සම්බන්ධයෙන් අදාළ වාර්තා හිඟ බදු අය කරගැනීමේ ඒකකය විසින් සකස් කර ඇත. (යම් යම් අවස්ථාවන්හි දී හිඟබදු අයකර ගැනීම සඳහා මෙන්ම ඒ හා සමඟ සබැඳි කරුණු සහ එයට අනන්‍ය වූ කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩ සහ වේගවත් ක්‍රියාවලියක් ඇතිකිරීම සඳහා වන පනතකි.)

## 4.3 හිඟබදු ප්‍රමාණය 3% මට්ටමේ පවත්වා ගැනීම

2010 අංක 16 දරණ හිඟබදු (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව, 2010 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලිත් වර්ෂයක අවසානය වනවිට මේ පනතේ උප ලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ මුදලක් හෝ අත්හිට වූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටසක් හැර, බදුවල මුළු එකතුව ඊට පෙරාතුව වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩි වන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීතිය යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදුවලින් සියයට තුනක් නොඉක්මවන බවට වග බලාගැනීම කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

ඒ අනුව,

| | | |
|---|---|---|
| 2012.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | - | රු. 10,248,070,817.00 |
| <u>අඩුකලා</u> | | |
| 2012.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | | රු.15,191,392,551.00 |
| 2012 වර්ෂයේ හිඟ බදු අඩුවීම | | රු.(4,943,321,734.00 ) |
| | | |
| 2011.12.31 දිනට මුළු බදු රැස්කිරීම් | - | රු.418,778,999,285.00 |
| 2012 මුළු බදු රැස්කිරීම් වලින් 3% | - | රු.12,563369,979.00 |

එබැවින් 2012 වසරේ දී හිඟ බදුවල ශුද්ධ එකතුවීමක් දක්නට නොමැත. ඒඅනුව 2010 අංක 16 දරණ හිඟ බදු පනත (විශේෂ විධිවිධාන) යටතේ අපේක්ෂිත කෙරෙන ආකාරයට එම අගය පෙර වර්ෂයේ මුළු බදු රැස් කිරීමෙන් 3% කට වඩා අඩු අගයක් ගනී.

## පරිච්ඡේදය 5 - විගණන, අතිරේක බදු රැස් කිරීම්, ආපසු ගෙවීම්, අය කිරීම් ක්‍රියාමාර්ග සහ අභියාචනා

### 5.1 විගණන

ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ඒකකයෙහි ස්වභාවය හා විශාලත්වයට අනුව, බදු ගෙවන්නන් සමස්තය ම හැකි පමණ පුළුල් ලෙසින් ආවරණය කිරීමේ අරමුණින් විගණනයන් සහ විමර්ශනයන් පවත්වනු ලැබේ. අනිකුත් ක්ෂේත්‍රයන්ට වඩා විමර්ශන උපක්‍රමයන් භාවිත කිරීමෙන් වඩාත් ඵලදායී ප්‍රතිඵල ලැබී ඇත්තේ විශාල බදු ගෙවන්නන් මගින් බව හඳුනාගෙන ඇත. ඒ අනුව විගණන කාර්යයන් සතුටුදායක මට්ටමින් සිදු කළ අතර, එමගින් අතිරේක බදු ප්‍රමාණයක් එක් රැස් කළ හැකි විය. එසේ රැස්කරන ලද අතිරේක බදු ප්‍රමාණය 24 සහ 25 වගු මගින් දැක්වේ.

